ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මඟ දූතයා

ශුද්ධ බයිබලය

"එතැන් පටන් යේසුස් වහන්සේ, පසුතැවිලි වෙයල්ලා. මක්නිසාද, ස්වර්ග රාජ්‍යය ළංවී තිබේය කියා දේශනා කරන්ට පටන්ගත් සේක." (මතෙව් 4:17)

81 වන වෙළුම අංක 03 (963) 2022 මැයි / ජූනි

"පසුතැවිලි වෙයල්ලා..., දෙවියන් වහන්සේගේ රාජ්‍යය අත ළඟය."

යේසුස් වහන්සේගේ දේශනා කිරීමේ සාරය කුමක්ද ...? උන්වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් ලෙස පියාණන් වහන්සේගේ හදවතේ ඇති පණිවිඩය බෙදාහැරිය සේක. උන්වහන්සේගේ මුඛයෙන් නික්මුනාවූ පළමුවන වචනය වූයේ **"පසුතැවිලි වෙයල්ලා"** (මතෙව් 4:7) මෙය යේසුස් වහන්සේගේ දේශනාවේ සාරයවී තිබුණු සේක.

අපගේ ස්වාමීන් වහන්සේ පැමිණිවිට උන්වහන්සේ ඉතා විශේෂිත වූ පණිවිඩයක් උන්වහන්සේගේ සෙනඟට ලබා දුන් සේක. මේ දේශය හරහා සහ ලෝකය වඩා ගමන් කරන විට ඉතා වැදගත් වූ සමහර කාරණා මගේ අවධානයට යොමු විය. දෙවියන් වහන්සේගේ සෙනඟට පසුතැවිලිවීම පිළිබඳව දේශනා කිරීම භයානක ලෙස අතපසුකර තිබිණි. එමෙන්ම දෙවියන් වහන්සේගේ සෙනඟ පාපයෙන් පිරී සිටින්නෝය. ගලවන්ට බැරි ලෙස මගේ අත කොටවෙලාවත්, නෑසෙන ලෙස මගේ කන් බිහිරි වෙලාවත් නැති බව (යෙසායා 59:1) ඔබ දැන ගැනීම මට අවශ්‍යව තිබේ යැයි උන්වහන්සේ පවසන සේක. ඔබගේ සිත තුල පාපය රඳවාගෙන ආරක්ෂා කරන්නේ නම් ස්වාමීන් වහන්සේ ඔබට ඇහුම්කන් නොදෙන බව උන්වහන්සේ මෙහිදී නොකියන සේක්ද ..? මම දෙවියන් වහන්සේගේ සෙනඟගේ ජීවිතවල පාපය සමඟ වඩා හොඳින් කටයුතු කළෙමි කියා දේවසේවකයන්ට පැවසිය හැකි විය යුතුය.

සමහර මනුෂ්‍යයන් සිතන්නේ පිඹීදීම උදෙසා යාච්ඤා කිරීම පසුතැවිල්ලට ආදේශකයක් බවයි. කොහොම හරි උන්වහන්සේගේ බලය තුළට පැමිණීම වෙනුවෙන් අපි යාච්ඤා කරනවාට උන්වහන්සේ සතුටුවන සේකැයි ඔවුන් සිතන්නෝය. දෙවියන් වහන්සේ මේ ආකාරයෙන් යම් දෙයක් පවසන සේක. "මම හැමදාම මෙහි සිටින අතර මම මගේ බලය ස්වර්ගයේ තැබුවේ නැත. ප්‍රශ්නය වී තිබෙන්නේ මගේ නොව නුඹලාගේය. මගේ අභිමුඛත්වය හඳුනාගන්නේ කෙසේදැයි නුඹලා අවබෝධ කරගෙන නැත. නුඹලා මට ප්‍රතිචාරය දක්වා නැත. දෙවියන් වහන්සේගේ සියලු බලය, දෙවියන් වහන්සේගේ සියලු පූර්ණත්වය, ඔබගේ සභාවේ හිසවන උන්වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේ තුල පවතින සේක. ප්‍රශ්නයවී තිබෙන්නේ අපි ඊට සුදුසු ආකාරයට නොසිටීමයි. අපි උන්වහන්සේගේ අභිමුඛත්වයට සහ උන්වහන්සේගේ බලයට ප්‍රතිචාරය දක්වන්නේ නැත.

පසුතැවිලිවීම යනු සුභවාදී වචනයකි

යෙසුස් වහන්සේගේ හදවත තුලින් උන්වහන්සේගේ සෙනඟ වෙතට පැමිණියා වූ පළමු වචනය "පසුතැවිලිවෙයල්ලා" යනුය. එය අසුභවාදී වචනයක් නොවේ. එය දෙවියන් වහන්සේ වෙතින් පැමිණෙන ඉතා සුභවාදී වචනයකි. මක්නිසාද එය සෑමවිටම දෙවියන් වහන්සේ ප්‍රකාශ කරන්නා වූ දේ සමඟ එකට ගමන් කරයි. "පසුතැවිලි වෙයල්ලා ..., ස්වර්ග රාජ්‍යය අත ළඟය." **නවත්** ආකාරයකින් පවසන්නේ නම්, පසුතැවිලි වෙන්න. මක්නිසාද දෙවියන් වහන්සේගේ රාජ්‍යය සම්පූර්ණයෙන්ම ඔබගේ ජීවිතයට එළිදරව් කිරීමට බලා සිටින සේක.

සැබෑ පසුතැවිලිවීම ඔබ වැරදි මාර්ගයක ගමන් කරමින් සිටින බව ඔබට අවබෝධ කරදෙනු ලබයි. ඔබගේ ජීවිතය තුළ බලය නැතිව සිටින්නේ ඇයි කියා ඔබ දන්නවාද .. ? ඔබ වැරදි දිසාවකට ගමන් කරමින් සිටින නිසාය. එහිදී ආත්මිකව ක්‍රිස්තුස් වහන්සේ සමඟ ගමන් කිරීමට සහ දෙවියන් වහන්සේගේ බලය අත්දැකීමට නොහැකිය ගෝලයන්ට තමන් කරමින් සිටිදේ අත්හැර යේසුස් වහන්සේ සමඟ යන්නට සිදුවිය. ඔවුන් එසේ කළේ නැද්ද... ? ප්‍රේතුස් සර්වබලධාරී දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය සහ බලය අත්දකිනු ලැබූ අතර ඔහුට තමන්ගේ ඔරුවේ රැඳී සිටීමට නොහැකි විය. ඔහුට යේසුස් වහන්සේ අනුව යාමටත් උන්වහන්සේ සිටින ස්ථානයේ සිටීමටත් සිදු විය. අප අතරේ බොහෝ දෙනා දෙවියන් වහන්සේගේ බලය සහ අභිමුඛත්වය සෙවූවත්, ඒ උදෙසා ක්‍රියා කලත් එය අත්නොදැකීමට හේතුව වන්නේ තමාට වුවමනා දිසාවටම ගමන් කරමින් අප හා සමඟ සම්බන්ධ වන්නැයි දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටිමින් සිටින නිසාය.

ශුද්ධ ලියවිල්ල අවබෝධ කරගනිමු

යේසුස් වහන්සේ, උන්වහන්සේගේ පියාණන් වහන්සේ වෙතට නැවත යාමට පෙර උන්වහන්සේගේ ගෝලයන්ට අවසනා ඉගැන්වීම ලබාදීමේ දී සිදු වූ දේ බලන්න. **"එවිට උන්වහන්සේ ඔවුන්ට ලියවිලි වැටහෙන පිණිස ඔවුන්ගේ සිත් පහදවා, ඔවුන්ට කියන සේක." (ලූක් 45°24) මෙය ඔබගේ ජීවිතයේ සිදුවී තිබෙනවාද ..? දෙවියන්**

හෙන්රි බැලැකබේ විසිනි

වහන්සේ ඔබගේ සිත පහදා ඔබට වුහුණට වුහුණ වුණගැසෙන තෙක් ඔබ සැලකිය යුතු කාලයක් දෙවියන් වහන්සේගේ වචනය සමඟ ගත කරනවාද ... ? දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ වචනය තුළ උන්වහන්සේව අනාවරණය කරන ආකාරය ඔබ අවබෝධ කරගන්නවාද ... ? ශුද්ධ ලියවිල්ල සමඟ දෙවියන් වහන්සේට ඔබගේ මනස සහ සිත ස්පර්ශ කිරීමට ඉඩ හරිනවාද ...?

පොළොවේදී පියාණන් වහන්සේගේ බලවත් වූ ක්‍රියාවන් උදෙසා යේසුස් වහන්සේගේ ගෝලයන්ව අවසාන කාරණාවලදීත් පිළියෙල කරමින් ඔවුන් ශුද්ධ ලියවිල්ල අවබෝධ කරගත යුතු බව උන්වහන්සේට හැගුණු සේක. දෙවියන් වහන්සේ ඔවුන්ට අනාවරණය කර තිබෙන ලෙස උන්වහන්සේගේ අභිප්‍රාය සහ ක්‍රියාකාරකම් ඔවුන් දැකීම අවශ්‍යව තිබුණේය. බොහෝ කිතුණුවන් වැඩියෙන් ක්‍රියාකරති. ඉවැන්ජලිස්ත කිතුණුවන් ශුද්ධ ලියවිල්ල නොමැතිව තමන්ගේම සිතෙන් සහ තමන්ගේම මනසින් තර්ක කරන්නේ එවිටය. අපි සිතන්නා වූ හොඳම දේ ලෝකයට අවශ්‍ය නොවේ. ලෝකයට අවශ්‍යය වන්නේ දෙවියන් වහන්සේ අනාවරණය කරන කාරණා වන්නේය.

එහිදී යේසුස් වහන්සේ කළේ කුමක්ද ..? **"එවිට උන්වහන්සේ ඔවුන්ට ලියවිලි වැටහෙන පිණිස ඔවුන්ගේ සිත් පහදවා, ඔවුන්ට කියනසේක්, මෙසේ ක්‍රිස්තුස් වහන්සේ වද විඳින්ටත්, තුන්වෙනිදා මළවුන්ගෙන් නැගිටින්ටත්, යෙරුසලමේ පටන් සියලු ජාතීන්ට පසුතැවිල්ල සහ පව්කමාවද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කරනු ලබන්ටත් යුතු යයි ලියා තිබේ."** (ලූක් 24:45-47) එය කියවන විට මම පැවසීමට පටන් ගන්නේ මේ ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත්වන නිසා මා තුලිනුත් මේ හා සමාන දේ පෙනෙනු ඇත කියායය. පාවුල්තුමා මේ ආකාරයෙන් පැවසුවේය. "මම ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසියෙහි ඇණගසනු ලැබ සිටිමි. " (ගලාති 2:20) ක්‍රිස්තුස් වහන්සේ මා උදෙසා කුරුසපත්වූවා යැයි එහිදී පාවුල්තුමා නොපවසන අතර මම ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසියෙහි ඇණ ගසනු ලැබ සිටිමි." කියා පවසා ඇත. එමෙන්ම ඔහු මෙලෙසිනුත් එකතු කර ඇත. "එසේ වුවත් මම

2 පිටුවට

1 පිටවෙන්

පසුතැවිලි වෙයල්ලා...

ජීවත්වෙමි.” ක්‍රිස්තුස් වහන්සේ මරුණු සේක. නැවත නැගිටුණු සේක. ඔබ උන්වහන්සේ සමඟ මරණයට පත්වූවාද .. ? ක්‍රිස්තුස් වහන්සේගේ නැවත නැගිටීමේ ජීවනය ඔබගේ ජීවිතය තුළ ගලා යනවාද ... ? පාපයේ බලයෙන් සහ පාපයේ ප්‍රතිවිපාක වලින් ඔබට ජයග්‍රහණය ලබාදමට දෙවියන් වහන්සේ කුරුසියේ දී කුමන ආකාරයේ හෝ බලයක් නිදහස් කළ සේක්ද .. ? නැවත නැගිටීමේ බලය නොමැති නම් පාපය ජයගෙන ඇත. නුමුත් ක්‍රිස්තුස් වහන්සේ මරණයෙන් නැගිටුණු නිසා මරණයෙන් නැගිටුණාවූ යේසුස් වහන්සේගේ බලය නිදහස් කළ සේක. උන්වහන්සේ කෙරෙහි අදහන්නා වූ සියල්ලන්ට එම බලය ලබා දී තිබෙන සේක. (එපීස 1:17-23) නැවත නැගිටීමේ බලය ඔබ අත්දැක තිබෙනවාද ..? ඔබ ක්‍රිස්තුස් වහන්සේ සමඟ ඒකත්වය ඇතිව සිටිනවා නම් උන්වහන්සේ කරන්නා වූ දේවල් ඔබ අත්දකිනු ලබනවා ඇත.

අපගේ සමාජයේ සියලුම ලොකටස් තුළ දෙවියන් වහ්නසේගේ සෙනඟට පසුතැවිලිවීම පිළිබඳව ප්‍රබල පණිවිඩියක් සමඟ ඔබ පැමිණියේ නම්, ඔවුන් ඔබට ඉතා දරුණු විය හැකිය. එවැනි පණිවිඩයක් අසන්නට ඔවුන්ට උවමනා නැත. ඔවුන්ට අවශ්‍යව තිබෙන්නේ දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ ඔවුන් වෙනුවෙන් පවතින්නා වූ ආශිර්වාද ගැන අසීමටය. නමුත් සියල්ලට කලින් දෙවියන් වහන්සේගේ රාජ්‍යය උදෙසා පසුතැවිලීම අවශ්‍යව තිබේ. ඔබගේ ජීවිතය උන්වහන්සේ සමඟ එකට බැඳී තිබීම අවශ්‍ය වේ. දෙවියන් වහන්සේ ඔබ සහ මා සමඟ කටයුතු කිරීමේ හදවත පාපය සමඟ කටයුතු කිරීමයි. උන්වහන්සේගේ මරණය අවශ්‍යව තිබුණා වූ හේතුවේ හරය එයයි.

පසුතැවිලිවීම සහ පිඹිදීම

දෙවියන් වහන්සේගේ සෙනඟ හැරී එන විට දෙවියන්වහන්සේගේ පූර්ණත්වයේ පිඹිදීම ඇතිවේ. මක්නිසාද පසුතැවිලි වෙද්දී ඔවුන් දෙවියන් වහන්සේ වෙතින් වෙනතකට ගමන් කරමින් සිටියා වූ මාර්ග යෙන් හැරී එන අතර දැන් ඔවුන්ට අවශ්‍ය වී ඇත්තේ දෙවියන් වහන්සේ සමඟ සිටීමටයි. ඔබ දෙවියන් වහන්සේ සමඟ හරිගැස්සෙන විට සිතාගත නොහැකි ලෙස ඔබ දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය සහ බලය අත්දකින්නෝය. ඔබ දෙවියන් වහන්සේ වෙතට ගොස් ප්‍රථමයෙන් ඔබව පවිත්‍ර කරන ලෙසත්, ඔබ තුළ ශුද්ධකම ගොඩ නගන ලෙස සහ දයාවේ මනුෂ්‍යයෙක් ලෙස අනිත් අය අතරට ඔබව ගෙන යාමට උන්වහන්සේගෙන් ඉල්ලා සිටින්නේ නැතිව දෙවියන් වහන්සේගේ බලය ඔබ තුලට එවන ලෙස ඉල්ලා නොසිටින්න. ඔබගේ ජීවිතයේ කාර්යයන්වලදී සහ ඔබගේ ජීවිතය තුලින් දෙවියන් වහන්සේගේ බලය නිදහස් වෙනවා දකින්නේ නැතිනම් සමහර කාරණා වලින් ඔබව නිදහස් කර ඔබව මුදාගන්නා ලෙස දෙවියන් වහන්සේගෙන් අයැද සිටීම අවශ්‍යව තිබේ. එම නිදහස අවශ්‍යව ඇත්තේ ඔබගේ මනසට ද ... ? ඔබගේ සිතටද ..? ඔබගේ ක්‍රියාවන්වලට ද ..? දෙවියන් වහන්සේගේ ශුද්ධකම සමඟ ගැලපෙන්නේ නැත්තේ කුමක්ද ..?

පසුතැවිලිවීමෙන් පවසන්නට අදහස් කරන්නේ දෙවියන්වහන්ස .., ඔබවහන්සේ සමඟ මාගේ ගමන් කිරීම නිදැල්ලේ හෝ සැලකිල්ලක් නැතුව ගමන් කිරීමට ඉඩ හැරිය මැනව. ඔබවහන්සේ මගේ ජීවිතය තුළ ප්‍රකාශ කරන්නා වූ බලය සහ ඔබගේ අභිමුඛත්වය නොමැතිව තෘප්තිමත්වීමට ඉඩනැරිය මැනව. ඔබවහන්සේගේ කාර්යයන්වලට බාධාවන්ව තිබෙන්නා වූ දේ කුමක් වුවත් ඔබ මට එය එළිදරව් කරන විට ක්ෂණිකව මම ඒ කාරණය ගැන පසුතැවිලි වන්නෙමි.

අප අතරේ බෙහෝ දෙනා දෙවියන් වහන්සේට සම්පූර්ණයෙන් යටහත්වීමෙන් එක් යාච්ඤාවක නොකඩවා පවතින්නෝය. කෙසේ වෙතත් අපි අනුමානයෙන් යුතුව මේ ආකාරයෙන් එක් සරල යාච්ඤාවක්වත් කර ඇත. "ස්වාමීන් වහන්ස, මා තුළ ඇති සියල්ලෙන් මම ඔබ වහන්සේට උවමනා සියල්ලට යටත් වන්නෙමි.” තවත් සමහර අය මෙසේ පවසනවා විය හැකිය. මම හිටපු තැන තවත් මම ඉන්න යන්නෙ නැහැ. මම දෙවියන් වහන්සේ සමඟ ඇති සම්බන්ධතාවය මුළුමනින්ම අලුත් මට්ටමකට ගෙන එන්නට යනවා. දෙවියන් වහන්සේ සමඟ නැවුම්බවක් අත්දැකීමට මට අවශ්‍යව තිබේ. ”

යේසුස් වහන්ස ..., ඔබවහන්සේ පොළොවේ සිටි කාලයේ මනුෂ්‍යයන් උදෙසා කඳුළු සැලූ සේක. ඉන් කෙටි කාලයකට පසුව ප්‍රතිචාරය දැක්වූ අය දේව රාජ්‍යය උදෙසා ජීවත්වීම කොයි ආකාර දැයි අත්දැකීමට පැමිණියෝය. ඔවුන් හරහා මුළු රෝම අධිරාජ්‍යයම වෙනස් කරනු ලැබුවෝය. ඔබ වහන්සේ එය සංකීර්ණ නොකර මා අනුව යන්න ඔබ කැමතිදැයි අසන සේක. ධීවරයින්ව සිටි ගෝලයන් ක්ෂණිකවම ඔබ වහන්සේ සමඟ ගියෝය. ඔවුන්ගේ ජීවිතවල ප්‍රථමවතාවට ඔවුන්ගේ වැසී තිබුණා වූ දෑස් විවෘත වී සමූහයන් සහ කුෂ්ඨරෝගීන් සුවවෙනවාත්, කුණාටු නිශ්චල වෙනවාත්, දේවරාජ්‍යය පැමිණ ඇති බවත් ඔවුන් අත්දුටුවෝය.

දෙවියන් වහන්ස .... අපට ඔබවහන්සේ සමඟ සිටින්නට වුවමනාය. එම නිසා ඔබවහන්සේ පිළිබඳව අපි අසා තිබෙන්නාවූ සාක්ෂි තවත් වර්ධනය වන පිණිස අපගේ ජීවිත නිදහස් කළ මැනව. අපි ඔබ වහන්සේ වෙතට හැරී එන්නෙමු. අපි පසු තැවිලි විය යුතු කෙසේදැයි අපට පෙන්වා දුන මැනව. ඉන් අනතුරුව ඔබ වහන්සේ, ඔබගේ සෙනඟව පුබුදුවාලීමෙන් සිදුවන්නේ කුමක්දැයි ලෝකයේ අයට දකින්නටත්, නැතිවී සිටින ලේකයේ අයට අප තුළ ගැලවුම්කරුවාණන්ව දැකීමටත් සැලැස්සුව මැනව. අපි යේසුස් වහන්සේගේ නාමයෙන් ඉල්ලා සිටින්නෙමු. ආමේන් ...

අප තුළ ක්‍රිස්තුස් වහන්සේගේ මහිමයේ බලාපොරොත්තුව

රිවි කාර්මයිකල් විසිනි

පෙරමඟ දූතයා මෙම කලාපය පසුතැවිලිවීම සහ පිඹිදීමේ ගෙත්මාවන් ඉලක්ක කරගෙන අපගේ ජීවිත දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණවීමත් සමඟ සේවයේ සිදුවන වැදගත් කාරණාත් ඊට එකතුකර ඇත. මෙම පණිවිඩ වලින් ධෛර්යමත් කරමින් බලයෙන් පූර්ණව අපට මතක් කර දෙන්නේ ඵල දැරීමෙන් සහ උතුරා පිටාර ගලා යන ආත්මික ජීවිතයක් අප තුළ ස්වාමීන් වහන්සේට අවශ්‍ය බවයි. අපගේ ජීවිත සෝදිසි කරගෙන අපගේ ජීවිතවල සහ සේවයේ පූර්ණත්වයට බාධා කරන්නා වූ ඕනෑම කාරණාවක් පිළිබඳව පසුතැවිලීමටත් අපව කැඳවනු ලබන්නෝය.

"හෙන්රි බ්ලැකබේ” පළමුවන ලිපියෙන් පෙන්වා දී තිබෙන්නේ පසුතැවිලිවීම ස්වාමීන් වහන්සේ වෙතින් පැමිණෙන ඉතා සුභවාදී වචනයක් බවයි. මක්නිසාද අපි බලා සිටින්නාවූ දෙවියන් වහන්සේගේ රාජ්‍යය අත ළඟ බව මතක්කරදීම සමඟ එය විදහා දැක්වීමට ඔහු අපව යොමු කරවයි. තවත් ආකාරයකින් කියනවා නම් අපි පසුතැවිලි වන විට සහ ක්‍රිස්තුස් වහන්සේ සමඟ ගමන් කිරීමට පියවර තබන විට, දෙවියන් වහන්සේගේ අස්වාභාවික ක්‍රියාවන් අත්දැකීම්, දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය, දෙවියන් වහන්සේගේ බලය, දෙවියන් වහන්සේගේ සමාදානය, දෙවියන් වහන්සේගේ ප්‍රීතිය, දෙවියන් වහන්සේගේ ප්‍රේමය, වඩ වඩා අපගේ ජීවිතවල පූර්ණවීමට පුළුවන් බව අපි අපේක්ෂා කරන්නෙමු.

ජීවනදායක ජලය ඇති ගංගා

අපගේ හදවත් තුළ ජීවනදායක ජලය ඇති ගංගා ගලායාම දෙවියන් වහන්සේට උවමනා වී තිබෙන බවට සැකයක් නැත. ඔබ සහ මා උදෙසා උන්වහන්සේගේ කැමැත්ත නම් උන්වහන්සේගේ ආත්මයෙන් උන්වහන්සේගේ ඵලවලින් පූර්ණවී උන්වහන්සේගේ පුත්‍රයාණන්ගේ ස්වරූපයට පිලිලෙ කිරීම වන සේක. උන්වහන්සේගේ වචනයෙන් ද අප පූර්ණ වී එය නිර්භීත ලෙස අනිත් අය සමඟ බෙදාගැනීමත් උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක. උන්වහන්සේගේ ශක්තියේ බලවත්කමෙහිද බලවත්වීම උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක. (එපීස 6:10) අපි උන්වහන්සේගේ ශක්තිය තුළ සේවය කිරීමටත්, යහපත් කාර්යයන් ඉටු කිරීමට බලය ඇතිව සිටීමටත් **පරීක්ෂණවලින් ජය ගැනීමටත්, දේව භක්තික ජීවිතයක් ගත කිරීමටත් උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක.**

අපි ප්‍රේමයේ මුල් ඇද පිහිටා සිටීමත් උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක. (එපීස 3:17) අපගේ ප්‍රේමය වර්ධනය වී එකිනෙකා කෙරෙහි ප්‍රේමය වැඩිවන පිණිසත් දෙවියන් වහන්සේට අවශ්‍යව තිබෙන සේක. (1 තෙසලෝනික 3:12) ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමයේ දිග, පළල, උස, ගැඹුර,සම්පූර්ණයෙන්ම අවබෝධ කරගෙන (දැනගෙන) ඒ තුළ ගමන් කිරීමක් උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක. (එපීස 5:2, 3:18-19) අපගේ ජීවිත ප්‍රීතියෙන් පූර්ණවීමත් උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක. ප්‍රීතියෙන් ගායනා කිරීමටත්. ඔල්වර හඬදීමටත්, අපව යොමු කරන සේක. (ගීතාවලිය 65:13) ප්‍රීතිය අධිකව සදාකාලිකව සහ වචනයෙන් කිව නොහැකි මහිමයේ පූර්ණත්වය ලබාදෙන සේක. (ගීතාවලිය 43:4, යෙසෙයා 35:10, 1 ප්‍රේතුස් 1:8-9)

බය හෝ කරදර පවතින විට අපගේ හදවත්වල සමාදානය පූර්ණව පවත්වා ගැනීම උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක. (යොහාන් 14:27) කිසි නුවණකින් දැනගත නොහැකි සමාදානයෙන් අපගේ සිත් ආරක්ෂා කිරීමට උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක. (පිල්ප්පි 4:7)

3 පිටුවට

“මම ප්‍රේමකරන සියල්ලන්ට තරවටුකොට දඬුවම් කරමි. එබැවින් නුඹ ජ්වලිතව සිට පශ්චත්තාපවෙයන්න.” (එළිදරව් 3:19)

2 පිටවෙන්

අප තුළ ක්‍රිස්තුස් වහන්සේගේ...

ක්‍රිස්තුස් වහන්සේ අප තුළ සිටින සේක

බිඳවැටුණාවූ ලෝකයක සහ අප මුහුණ දෙන්නා වූ බොහෝ පොරබැඳීම් සහ සෝදිසි කිරීම් මධ්‍යයේ ඉහතින් සඳහන් කර තිබෙන ආකාරයේ කාරණා සිදුවන්නේ කෙසේද ...? පිළිතුර ඇත්තටම ඉතා සරලව තිබේ. ආත්මික පූර්ණත්වය සහ ඵලදැරීමේ පූර්ණත්වය අප තුළ සිටින්නා වූ ක්‍රිස්තුස් වහන්සේ වෙතින් පැ**විණේ. අප ක්‍රි**ස්තුස් වහන්සේ තුළ වාසය කරන විට සහ ක්‍රිස්තුස් වහන්සේ අප තුළ වාසය කරන විට ස්වභාවිකවම හෝ අස්වාභාවිකව උන්වහන්සේගේ ජීවනය ගලායාම සහ උන්වහන්සේගේ මහිමය උදෙසා බොහෝ ඵල දැරීම අප තුළ සිදුවන්නේය. (යොහාන් 15: 4-8) අනිත් පැත්තෙන් උන්වහන්සේගෙන් වෙන්ව අපට කිසිවක් කළ නොහැකිය. (යොහාන් 15:5)

"ඔස්වල්ඩ් චැම්බර්" දිනපතා ඔහුගේ මෙනෙහි කිරීම්වලදී මෙලෙස පවසා ඇත. "මම සැකයක් නැතිව යේසුස් වහන්සේ වෙතට පැමිණෙන්නේ නම් මාගේ සැබෑ ජීවිතය මගේ සැබෑ ආශාවන් සමඟ එකඟ වනු ඇත. මම ඇත්තවශයෙන්ම පාපයෙන් වළකිනවා නම්, මාගේ ජීවිතයේ ස්වාමීන් වහන්සේගේ ගීතිකාව ආරම්භවීම සොයාගන්නවා ඇත. යේසුස් වහන්සේ සමඟ පුද්ගලික සම්බන්ධතාවය සියලුම දේ වෙනස් කරනවා ඇත.

"හෙන්රි **බ්ලැකබේ" වෙනස් ආකාරයකින් මෙසේ පැවසුවේය. "ආත්මිකව ක්‍රිස්තුස් වහනසේ සමඟ ගමන් කිරීමට නොහැකි වන විට දෙවියන් වහන්සේගේ බලය අත්දැකීමට නුපුළුවන. නැවත නැගිටීමේ බලය ඔබ අත්දැක තිබෙනවාද ..? ඔබ ක්‍රිස්තුස් වහන්සේ සමඟ ඒකත්වය ඇතුව සිටින්නේ නම් උන්වහන්සේ කරන්නේ කුමක්දැයි ඔබ අත්දකිනු ඇත.** ඒ ආකාරයෙන්ම ඇන්ඩ්‍රෑ මරේ **විස්තර** කරන්නා වූ විශ්මයජනක සත්‍යතාවය දෙස සැලකිලිමත් ලෙස බලන්න. යේසුස් වහන්සේ අපට ස්වර්ගීය පාරිශුද්ධත්වය, බලය සහ ජීවිතය ප්‍රකාශ කරන (සන්නිවේදනය කරන) සේක. අපි ස්වර්ගීය උන්වහන්සේ සමඟ ජීවත් වන්නෙමු. ස්වර්ගීය උන්වහන්සේ අප තුළ ජීවත්වන සේක. උන්වහන්සේ තුළ අපගේ හදවත් පැවතීමෙන් ස්වර්ග රාජ්‍යය අප අතරේ **පවතින්නේය. දෙවියන් වහන්සේගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් පොළොවේ සිදුවන්නේ එවිටය. එය නිශ්චිතවම ඉටුවන බව විශ්වාස කිරීමට හැකි වන පිණිස ඉඩ හරිවු.**

සාමාන්‍යයෙන් ක්‍රිස්තුස් වහන්සේ අප තුළ සිටීම ඇදහිලිවන්තයෙක් ලෙස ගාම්භීරව තිබේ. "***මම ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසියෙහි ඇණ ගසනු ලැබ සිටිමි. එසේවී නමුත් මම ජීවත්වෙමි. නමුත් නවත් මා නොව ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත්වන සේක. නවද මා දැන් මංශයෙහි ජීවත්වන ජීවිතය මට ප්‍රේම කළා වූ මා උදෙසා තමන්ම පාවා දුන්නා වූ දෙවියන් වහ්නසේගේ පුත්‍රයාණන් වහන්සේ කෙරෙහි අදහිල්ලෙන් ජීවත් වෙමි. "*** (ගලාති 2:20) අප තුළ උන්වහන්සේගේ බලය උතුරා පිටාර ගලායාම පුදුමයක් නොවේ. උන්වහන්සේ සියලු බලයෙන් පූර්ණව සිටින සේක. එමෙන්ම උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලයෙන් සහ ශක්තියෙන් අප තුළ බලවත් ලෙස ක්‍රියා කරන සේක. (එපීස 1:19, 3:20, කොලොස්සි 1:29) උන්වහන්සේගේ ප්‍රේමය අප තුළ උතුරා පිටාර ගලායාම පුදුමයක් නොවේ. මන්ද උන්වහන්සේ ප්‍රේමයයි. (1 යොහාන් 4:8) උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහ්නසේ කරුණුකොටගෙන උන්වහන්සේගේ ප්‍රේමය අපගේ හදවත් වලට වගුරුවන සේක. (රෝම 5:5) අප ප්‍රීතියෙන් පූර්ණව සිටීම පුදුමයක් නොවේ. ප්‍රීතියේ පූර්ණත්වය පැමිණෙන්නේ උන්වහන්සේගේ අභිමුඛත්වයෙනි. අපි ගැඹුරු සමාදානය ඇතිව සිටීම පුදුමයක් නොවේ. මක්නිසාද උන්වහන්සේ සමාදානයේ ස්වාමීන් වහන්සේය. සෑම කාර්යයකදීම සහ සෑම අවස්ථාවකදීම අපට සමාදානය ගෙන දෙන්නේ උන්වහන්සේය. (2 තෙසලෝනික 3:16) අපි ශුද්ධ වූ සහ දේවභක්තික ජීවිත ගත කිරීම පුදුමයක් නොවේ මක්නිසාද අපව පවිත්‍ර කරන්නේ උන්වහන්සේ වන සේක. (හෙබ්‍රෙව් 2:11) එමෙන්ම, "***උන්වහන්සේ කරුණු කොටගෙන නුඹලා ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ සිටින්නාහුය. ඒ තැනැත්තවහන්සේ දෙවියන් වහන්සේගෙන් අපට ප්‍රඥාව එනම් ධර්මිෂ්ඨකමද, ශුද්ධකමද, විඳීමද කරනු ලැබූ සේක. "*** (1 කොරින්ති 1:30) තවත් ආකාරයකින් පවසන්නේ නම් උන්වහන්සේ අපගේ ජීවනයයි. (කොලොස්සි 3:4)

පසුතැවිලිවීම සහ පිබිදීම

පසුතැවිලිවීමේ සත්‍යතාවය ඉතාම වැදගත්ව තිබේ. බේදවාචකයක් ලෙස අපගේ ජීවිතවල ජීවනයේ බහුලත්වය සහ ඵලදැරීමෙන් පූර්ණවීම අහිමිවී තිබෙන්නේ කෙසේද ..? අපගේ ජීවිත තුළ පවතින පාපය නිසාය. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ ප්‍රේමය සහ අප උදෙසා දක්වන සැලකිල්ල නිසා පසුතැවිලිවීමට අපව කැඳවන සේක. "***නොහොත් නුඹ පසුතැවිල්ලට පමුණුවනපිණිස දෙවියන් වහන්සේගේ යහපත්කමප පවතින බව නොදැන උන්වහ්නසේගේ යහපත්කමේද, ක්ෂාන්තියේද, ඉවසීමේද, බහුලත්ව සුළුකොට සිතා නුඹේ සිතේ මුරන්ඩුකමෙන්ද පසුතැවිලි නොවන සිතින් ද දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ඨ වූ විනිශ්චය එළිදරවිවන උදහසේ දවසට නුඹ උදහස රැස් කරගන්නෙහිද .. ? "*** (රෝම 2:4-5) ක්‍රිස්තුස් වහන්සේ ප්‍රකාශවී මෙලෙස පැවසූ සේක. "***මම ප්‍රේමකරන සියල්ලන්ට තරවටුකොට දඬුවම් කරමි. එබැවින් නුඹ ඡවලිතව සිට පශ්චාත්තාපවෙයන්න.***" (එළිදරව් 3:19) උන්වහන්සේ පසුතැවිලිවීමට කැඳවන සේක. මක්නිසාද පසුතැවිලිවී ගැලවීම වෙතට අපව යොමු කර ජීවිතය සහ කාලය නැවුම් කරන සේක. "***මක්නිසාද දේවකැවැත්තට එකඟ වූ ශෝකයෙන් තැවෙන්ට කාරණයක් නොවන්නාවූ ගැළවීමට පුවුණුවන පසුතැවිලිවීම හටගන්නේය.***" (***2 කොරින්ති 7:10***) "***ඔවුහු ඒ අසා, නිශ්ශබ්දවී, දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් එසේ වී නම් දෙවියන් වහන්සේ අන්‍යජාතීන්ටත් ජීවනය පිණිස වූ පශ්චාත්තාපය දුන් සේකැයි කීවෝය.***" (ක්‍රියා 11:18) "***එබැවින් ස්වාමීන් වහන්සේ ඉදිරියෙන් සැනසිලි කාලයක් පැවිණෙන ලෙසද, නුඹලා උදෙසා නියමකරන ලද්දා වූ ක්‍රිස්තුස් වහන්සේ එනවි, යේසුස් වහන්සේ එවන පිණිසද, නුඹලාගේ පාපයන් මකා දමනු ලබන පිණිසද පශ්චාත්තාපව හැරියල්ලා.***" (ක්‍රියා 3:19-20)

එබැවින් මෙය පිබිදීම උදෙසා ස්වාමීන් වහන්සේව සෙවීමට සහ සම්පූර්ණයෙන්ම ගැඹුරින්ම පසුතැවිලිවීමට කාලයයි. තවදුරටත් පාප රහිතව සිටිය යුතුය. ඇල්මැරී නොසිටිය යුතුය. තමන්ම තෘප්තියට පැමිණෙන්නේ නැතිව සිටිය යුතුය. සීමාරහිතව ස්වාමීන් වහන්සේ වෙතට හැරීමටත්, අප තුළින් උන්වහන්සේගේ මහිමය ප්‍රකාශ වී උන්වහන්සේගේ ක්‍රියාව අප තුළ සම්පූර්ණයෙන්ම ඉටුවන පිණිස උන්වහන්සේට යටහත්වීමටත්, කාලය මෙයයි. අප තුළ වාසය කරන්නා වූ ක්‍රිස්තුස් වහන්සේගේ සමාදානය, ප්‍රීතිය, ධර්මිෂ්ඨකම, බලය, ප්‍රේමය උන්වහන්සේව මුහුණට මුහුණ මුණගැසීම අප වටා ලෝකයේ අයට දැකීමට උවමනා කරන්නේය. උන්වහන්සේ වර්ධනය වෙන්ටත්, අපි අඩුවෙන්ටත් උවමනාය. (යොහාන් 3:30) බලාපොරොත්තුවේ තේජස ක්‍රිස්තුස් වහන්සේ අප තුළ වාසය කිරීමයි. (කොලොස්සි 1:27)

"***ඔබගේ සෙනඟ ඔබ කෙරෙහි ප්‍රතිඵල වන පිණිස අප නැවත ජීවත් නොකරන සේක්ද ..? ස්වාමීනී ...., ඔබගේ කරුණාව අපට දැක්වුව මැනව. ඔබගේ ගැලවීම අපට දුන මැනව. දෙවි වූ ස්වාමීන් වහන්සේ කුමක් කියන සේක්දැයි අසන්නෙමි. මක්නිසාද උන්වහන්සේ ස්වකීය සෙනඟටත්, ශුද්ධවන්තයන්ටත්, සමාදානය වදාරන සේක. නමුත් ඔවහු අඥානකමට නැවත නොහැරෙත්වා. තේජස අපේ දේශයේ වසන පිණිස සැබවින්ම උන්වහ්සේගේ ගැලවීම උන්වහන්සේට බයවෙන්නන් සමීපයෙහිය.***" (ගීතාවලිය 85:6-9)

ආත්මයාණන් වහන්සේ නව ජීවනයක් ගෙන දෙයි.

දෙවියන් වහන්සේ අපව අලුත් ජීවිතයකට කැඳවා තිබෙන සේක. එය ජීවිතයේ සමහර පියවරයන් තුළ අළුත්වීමක් නොව, සමහර අළුත් පුරුදු, මාර්ග, අභිප්‍රායන්, බලාපොරොත්තු තුළ අළුත්වීමක් නොව, ජීවිතය අළුත්වීමයි. මෙම කාර්යය ඉටු කිරීම පිණිස ශුද්ධාත්මයාණන් වහන්සේ බලයෙන් යුක්තව ලෝකයට පැමිණ මනුෂ්‍යයාගේ ජීවිත තුළ වාසය කරමින් පරණ ජීවිතය ඉවත්කර අළුත් ජීවිතයක් ගෙන දෙන සේක.

කිතුණුවෙක් වන සෑම කෙනෙක්ම ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසියේ ඇණ ගසා , උන්වහන්සේ සමඟ මරණයට පත්වී, උන්වහන්සේ සමඟ තැන්පත් කරනු ලැබ, උන්වහන්සේ සමඟ නැවත නැගිට, උන්වහන්සේ සමඟ ඔසවාගනු ලබා ස්වර්ගීය ස්ථානවල උන්වහන්සේ සමග හිදගනු ලබන්නෝය. (රෝම 6:3-9 ගලාති 2:20, එපීස 2:5-6 , කොලොස්සි 3:1-4) කිතුණුවන් තමන්ගේ ජීවිතවල පාපයට මැරී දෙවියන් වහන්සේ තුළට ජීවත්වනු ලබයි. (රෝම

හොරටියස් බෝනර් විසිනි (1808- 1889)

6:11) එහි ප්‍රතිඵලය වශයෙන් ඔවුන් අධර්මිෂ්ඨකමේ පාපය තුළ පාවිච්චි වෙන්නා වූ සාමාජිකයෙක් නොවේ. නමුත් ඔහු තමාගේ ජීවිතය තුළ දෙවියන් වහන්සේට වාසය කිරීමට භාරදී මරණයෙන් නැගිට සිටින දෙවියන් වහන්සේගේ දර්මිෂ්ඨකමේ භාජනයක් ලෙස සිටින්නෝය.

4 පිටුවට

3 පිටවෙන්

ආත්මයාණන් වහන්සේ නව...

සොයන්නේය. ඉහළින් තිබෙන්නා වූ කාරණා මත බලාපොරොත්තුව (ලෙන්ගතුකම) තබාගන්නා අතර පොළොවේ කාරණා වලින් වැලකී සිටින්නෝය.

"ඉදින් නුඹලා ක්‍රිස්තුස් වහන්සේ සමඟ නැඟිටුවනු ලද්දහු නම් උසස් තැන්හී තිබෙන දේවල් සොයාපල්ලා. එහි ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහ්සේගේ දකුණු පැත්තේ වැඩ හිඳින සේක. පොළොවේ තිබෙන දේ නොව උසස් තැන්හි තිබෙන දේව සලකාපල්ලා. මක්නිසාද නුඹලා මළහුය. නුඹලාගේ ජීවනය ක්‍රිස්තුස් සමඟ දෙවියන් වහ්නසේ තුළ සඟවා තිබේ. අපේ ජීවනය වන ක්‍රිස්තුස් වහන්සේ ප්‍රකාශවෙන කළ නුඹලාත් උන්වහන්සේ සමඟ තේජසින් ප්‍රකාශ වන්නහුය. එබැවින් පොළොවේ තිබෙන නුඹලාගේ අවයවයන් එනම් වේශ්‍යාකමත්, අපිරිසිදුකමත්. කාමරාගයත්. නපුරු තෘෂ්ණාවත්, රූප වැඳීම වූ තෘෂ්ණාවත් නසාපල්ලා. " (කොලොස්සි 3:1-5)

සම්පූර්ණ අලුත්වීම තුල නපුර බැහැර කිරීමසහ යහපත ඇතුළත් කර ගැනීම යන කාරණා දෙකම සිදුවිය යුතුය. අපෝස්තුළුවරයා එයට ධර්මිෂ්ඨකම සහ ශුද්ධකම යන කාරණා දෙකම එකතු කර ඇති අතර ඉවත්කර දැමිය යුතු දේ මෙලෙස පවසා ඇත. **"නුඹලාගේ ජීවිතයේ පළමු හැසිරීම ලෙස රැවටිල්ලේ තෘෂ්ණාවල් අනුව දුෂ්ටවන්නා වූ පරණ මනුෂ්‍යයා පහකර දව නුඹලා නුඹලාගේ චිත්තාත්මයෙන් අලුත් කරනු ලැබ සැබෑවේ ධර්මිෂ්ඨකමින්ද, ශුද්ධකමින්ද, දෙවියන් වහන්සේට සමානව මවන ලද්දා වූ අලුත් මනුෂ්‍යයා පැළඳගන්නා ලෙසය."** (එපීස 4:22-24) සැබවින්ම ධර්මිෂ්ඨකමේ සහ ශුද්ධකමේ සත්‍යතාවය සැබෑව මත රැඳී පවතියි. අලුත් මනුෂ්‍යයා ලෙස අදහස් කරනු ලබන්නේ පිටතින් සහ ඇතුලතින් දෙවියන් වහන්සේ සහ මනුෂ්‍යයා ඉදිරියේ ශුද්ධකමට සහ ධර්මිෂ්ඨකමට පැමිණවීමයි. මෙම සත්‍යතාවය තුළ සිටීමින් ව්‍යස්ථාවට සහ සුභාරංචියට ගෞරවය දැක්වීමයි.

ඊළඟට අළුත් තත්ත්වයක් මත සිටිති. චරිතයේ සදාචාරය අලුත්වී, අලුත් ජීවිතයක්, අලුත් ප්‍රීතියක්, අලුත් ක්‍රියාවක් , අලුත් බලාපොරොත්තුවක් සඳහා කැඳවා තිබෙන සේක. දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ පුත්‍රයාණන් බොහෝ සහෝදරයන් අතරේ කුළුදුලා **වන පිණිස පුත්‍රයාණන්ගේ ස්වරූපයට අපව කලින් (පූර්වයෙන්) නියම කරනු ලැබූ සේක. (රෝම 8:29) "ලෝකය මැවීමට ප්‍රථමයෙන් ක්‍රිස්තුස් වහන්සේ තුළ අප තෝරාගත් ලෙසම උන්වහන්සේ තුළ ස්වර්ගීය ස්ථානවල සියලු ආත්මික ආශීර්වාද වලින් උන්වහන්සේ අපට ආශීර්වාද කළ සේක."** (එපීස 1:4)

ශුද්ධකමට කැඳවා තිබෙන සේක

ඊළඟට උන්වහන්සේ අපව ශුද්ධකමට කැඳවා තිබෙන සේක. (1 තෙසලෝනික 4:7) දැන් අප ශුද්ධකම සඳහා ඵලදැරිය යුතුය. **"නුවුත් දැන් නුඹලා පාපයෙන් නිදහස් කරන ලදුව දෙවියන් වහන්සේගේ දාසයොවී, ශුද්ධකම සඳහා වල දරන්නහුය. එහි කෙළවරද සදාකාල ජීවනයය. "(රෝම 6:22)** අපගේ සිත් ශුද්ධකමින් නිදොස්ව තිබෙන පිණිස ගොඩනැගිය යුතුය. **"වෙසේ අපගේ ස්වාමි වූ යේසුස් වහන්සේ තමන්ගේ සියලු ශුද්ධවන්තයන් සමඟ එන කළ නුඹලාගේ සිත් අපගේ පියවූ දෙවියන් වහන්සේ ඉදිරියෙහි ශුද්ධකමින් නිදොස්ව තිබෙන්ට ස්ථිර කරන සේක්වා."** (1 තෙසලෝනික 3:14) අප තුළ ශුද්ධකම අධිකව තිබිය යුතුය. **"මේ සියල්ල මෙසේ නාස්ති වෙන්ට තිබෙන බැවින් නුඹලා දෙවියන් වහන්සේගේ දවස පැමිණීම බලා සිටීමින්ද, ඒ ගැන උන්දුව ක්‍රියාකරමින්ද සියලු ආකාර ශුද්ධ වූ හැසිරීමෙහිත්, භක්තිවන්තකමෙහිත් කොයි ආකාර අයවල්ව සිටින්ට ඕනෑද ... ? "** (2 ප්‍රේත්‍රුස් 3:11) අපි ශුද්ධ වූ පූජකයන්ය. (1 ප්‍රේත්‍රුස් 2:5) **"දරුවන් මෙන් නුඹලා කැඳවූ තැනැත්තාහන්සේ ශුද්ධව සිටින්නාක් මෙන් නුඹලාත් නුඹලාගේ මුළු හැසිරීමේ දී ශුද්ධව සිටපල්ලා".** (1 පෙත්‍රුස් 1:15) **"උන්වහන්සේ අපේ ක්‍රියාවල ප්‍රකාරයට නොව තමන් වහන්සේගේම අභිප්‍රායේද ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ පූර්ව කාලවලට ප්‍රථමයෙන් අපට දෙන ලද කරුණාවේ ප්‍රකාරයට අප ගලවා ශුද්ධ වූ කැඳවීමකින් කැඳවාගත් සේක."** (2 තිමෝති 1:9) (එපීස 1:4)

ශුද්ධකම දෙවියන් වහන්සේගේ ්සවභාවයයි. උන්වහන්සේ ඊශ්‍රායෙල්ගේ ශුද්ධ තැනැත්වහන්සේය. ස්වර්ගයේ උන්වහන්සේට ශුද්ධය.... ශුද්ධය ...., ශුද්ධය...., කියා මොරගසනු ලබන්නෝය. (එළිදරව් 4:8) එම ශුද්ධ වූ ස්වභාවය ක්‍රිස්තුස් වහන්සේට සම්බන්ධකර පෙන්වා දෙන සේක. **"එබඳු වූ ශුද්ධ වූ නිවැරදි වූ, නොකිළිටුවූ, පව්කාරයන්ගෙන් වෙන් වූ ස්වර්ගවලට වඩා උස්සවී සිටින්නා වූ උත්තම පූජකයෙක් අපට යෝග්‍යය වූයේය."** (හෙබ්‍රෙව් 7:26)එය නපුරෙන් සහ නපුරු ලෝකයෙන් වෙන්වීමක් පමණක් නොව නමුත් එය දෙවියන් වහන්සේට සහ උන්වහන්සේගේ සේවයට වෙන්වීමකි.

මෙය අපගේ පුද්ගලිකත්වයේ සෑම අංශයකටම ශුද්ධකම හෝ පූජාවීම ව්‍යාප්තවීමයි. අපි කරන්නා වූ හෝ සිතන්නා වූ දේවලට බලපෑමක් ඇතිව අපගේ පැවැත්ම තුළ අපගේ ජීවිතයේ මුළුමනින්ම පැතිරී පිර යා යුතුය. අපි සැලසුම් කරන හෝ කථා කරන කුඩා හේ විශාල සහ පිටස්තරයෙන් හෝ ඇතුලාන්තයෙන් සුභවාදී හෝ අසුභවාදී අපගේ සෙනෙහෙවන්ත හෝ අකමැති, අපගේ වේදනාවන් හෝ ප්‍රතිමත්වීම්, අපගෙ විනෝදවීම්, අපගේ රාජකාරීන්, අපගේ මිත්‍ර සබඳකම්, අපගේ නෑ සබඳකම්, අපගේ නිශ්චලවීම්, අපගේ කතා කිරීම්, අපගේ කියවීම්, අපගේ ලිවීම්, අපගේ පිටත්වයෑම්, නැවත පැමිණීම්, අපගේ ආත්මය, ප්‍රාණය, ශරීරය යන මුලු මනුෂ්‍යයා තුළ ඇති සෑම අවස්ථාවක්ම (ක්‍රියාවක්ම) ඊට ඇතුළත්ව තිබේ. අපගේ නිවස තුළ හෝ ඉන් පිටත ඕනෑම ස්ථානයකදී ශුද්ධකමට කැපවුණා වූ ජීවිතයක් අප තුලින් දැකීමට තිබුය යතුය.

පාපය උදෙසා නොව ධර්මිෂ්ඨකම උදෙසා නැගීසිටීම දෙවියන් වහන්සේ අපට දී ඇති පණිවිඩයයි. (1 කොරින්ති 15:34) **"මක්නිසාද මා ශුද්ධව සිටින හෙයින් නුඹලාත් ශුද්ධව සිටිය යුතු යයි ලියා තිබේ."** (1 ප්‍රේත්‍රුස් 1:16) **"එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයන් ජීවමානවූ, ශුද්ධ වූ, දෙවියන් වහන්සේ විසින් පිළිගත හැකි වූ යාගයක් කොට ඔප්පු කරන හැටියට දෙවියන් වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලමි. එය නුඹලාගේ ආත්මික සේවය වේ."** (රෝම 12:1) **"මුහුන් නැත්තාවූ නුඹලා අලුත් පිඬක් වන පිණිස පරණ ලුහුන් පහකරපල්ලා. කුවක් හෙයින්ද අපගේ පාස්කුව එනම්, ක්‍රිස්තුස් වහන්සේ යාග කරන ලද්දේය."** (1 කොරින්ති 5:7) **"එසේද වුවත්, ස්වාමීන් වහන්සේ තමන්ගේ අය දන්නා සේකැයිද ස්වාමීන් වහන්සේගේ නාමය සඳහන් කරන සියල්ලෝ අධර්මිෂ්ඨකමින් පහවෙත්තා යයිද යන වදාව ඇතුව දෙවියන් වහන්සේගේ ස්ථිර අත්තිවාරම පවත්නේය. "** (2 තිමෝති 2:19)

"අභක්තිකකමද , ලෞකික තෘෂ්ණාද එපාකර ආශීර්වාදලත් බලාපොරොත්තුව ගැනත් මහෝත්තම දෙවියන් වහන්සේගේද අපගේ ගැලවුවිකාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේද තේජසේ ප්‍රකාශවීම ගැනත් බලා සිටිමින් සිහියෙන් යුක්තවද, ධර්මිෂ්ඨ ලෙසද, භක්තිවන්ත ලෙසද, මේ ලෝකයෙහි ජීවත්වන පිණිස ඒ කරුණාව අප දැනුවැති කරන්නේය." (තීතස් 2:12-13) **"ඉන්නිසා ප්‍රේවවන්තයෙනි, නුඹලා මේ දෙවල් බලා සිටින බැවින් උන්වහන්සේ ඉදිරියෙහි කැළැල් රහිතව, නිදොස්ව, සමාදානයෙන් යුක්තව දකිනු ලබන පිණිස උත්සාහ කරපල්ලා."** (2 ප්‍රේත්‍රුස් 3:14) **"වම ඇවින් නුඹලා දක්නෙමි. නමුත්, ඇත්ව සිටින්නෙමි. නමුත් නුඹලා එකම ආත්මයෙන් ස්ථිරව, එක සිතකින් සුභාරංචියේ ඇදහිල්ල ගැන වීර්යය කරමින් විරුද්ධව සිටින්නන්ට කිසිවක් ගැන භීත නොවී සිටින බ වමට අසන්නට පුළුවන් වන පිණිස ක්‍රිස්තුස් වහන්සේගේ සුභාරංචියට ගඛින ලෙස හැසිරියල්ලා."** (පිලිප්පි 1:27)

"අන්ධකාරයේ වල නැති ක්‍රියාවලට හවුල් නොවී ඒවාට දෙස් තබාපල්ලා" (එපීස 5:11) **"නුවුත් තෘෂ්ණා පූර්ණ කරන පිණිස මාංශයට පංගාඛවක් නොකොට ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පැළඳගනිල්ලා"** (රෝම 13:14) **"ප්‍රේවවන්තයෙනි, නුඹලා ආගන්තුකයන් ද, විදේශීන්ද මෙන් ආත්මයට විරුද්ධව යුද්ධකරන මාංශික තෘෂ්ණා වලින් වැලකී සිටින ලෙස නුඹලාගෙන් ඉල්ලමි."** (1 ප්‍රේත්‍රුස් 2:11)

පාපයෙන් ඊළඟට සෑම හැඟීමකින්ම සහ සෑම අංශයකින්ම දෙවියන් වහ්නසේ අපව කැඳවන සේක. සියලුම අපවිත්‍රකම්වලින්, අධර්මිෂ්ඨකම්වලින්, සියලුම දූෂිතවීම් වලින් සියලුම වංක ක්‍රියා මාර්ග වලින්, සියලුම අකීකරුකම් වලින්, ආත්මයේ සහ මාංශයේ සියලුම අපවිත්‍රකම් වලින් දෙවියන් වහන්සේගේ පුත්‍ර වූ යෙසුස් ක්‍රිස්තුස් වහන්සේ වෙතට පැමිණෙන ලෙස අපව කැඳවා තිබෙන සේක.

ශුද්ධාත්මයාණන් වහන්සේගේ සැපයීම

අප තුළ කුමන ආකාරයේ හෝ ආත්මික මිත්‍යාවන් තිබෙන්නට හැකිය. ඒ දෙව වචනයේ කිසියම් ආකාරයක අඩුපාඩුවක් නිසා නොවේ. සුභාරංචිය පිළිබඳව යම් නොපැහැදිලිකමක් තිබිය හැකිය. දිව්‍යමය ත්‍යාගශීලීබව තුළ කුඩා හෝ සීමාසහිත ඕනෑම දෙයකදී පියාණන් වහ්නසේගේ වාසය කිරීමේ පූර්ණත්වයේ සතුටුවීම තුළ යම් කෙනෙක් අඩුව සිටිය හැකිය. දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ ස්වභාවයට අපව සාදන පිණිස අවශ්‍ය දේ සපයා දෙන සේක. එබැවින් උන්වහන්සේගේ මෙම ස්වභාවයට අපව කැඳවන සේක. දිව්‍යමය ආකෘතිය උසස්ථානයේ පවතින්නේය. එම නිසා පහලට පැමිණ පැවතීමට නොහැකිය. එබැවින් එයට සම්බන්ධවීමට

5 පිටුවට

4 පිටවෙන්

ආත්මයාණන් වහන්සේ නව...

හැකිවීම සඳහා ශක්තිය ලබාදී තිබෙන සේක. ශුද්ධව සිටීමේ අපගේ වගකීම මහත්ව තිබෙන නමුත් එය සම්පූර්ණයෙන්ම සාක්ෂාත් කර ගැනීම සඳහා සපයා දී තිබෙන මාධ්‍යයන්ට වඩා විශාල නොවේ.

දේව ස්වභාවයේ ශරීරය තුළ ක්‍රිස්තුස් වහන්සේගේ මුළු පූර්ණත්වය වාසය කරන සේක. උන්වහන්සේ අපට ශුද්ධාත්මයාණන් වහන්සේව ලබා දී තිබෙන සේක.

මෙම ආත්මයාණන් වහන්සේව අපට දී තිබෙන්නේ නිදහසේ සඵලවීම සඳහාය. අප එය ලබාගන්නා විට, **"නුමුත් අපෙන් එක් එක්කෙනාට ක්‍රිස්තුස් වහන්සේගේ දීමනාවේ ප්‍රමාණයේ හැටියට අනුග්‍රහය දෙන ලද්දේය."** (එපීස 4:7) මුල් සභාවේ ශුද්ධවන්තයන් ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් පූර්ණ වී ප්‍රීතිවූහ. **"ගෝලයෝ වනාහී ප්‍රීතියෙන්ද, ශුද්ධාත්මයෙන්ද පූර්ණ වූහ."** (ක්‍රියා 13:52) අපිත් එය ලබාගත යුතුය. **"මුදික පානයෙන් මත් නොවෙල්ලා. එයින් අනාචාරකම් හටගන්නේය. නමුත් ආත්මයාණන් වහන්සේගෙන් පූර්ණ වී, ගීතිකාවලින්ද, කවිවලින්ද, ආත්මික ගී වලින්ද, එකිනෙකාට කථාකොට නුඹලාගේ සිත්වලින් ස්වාමීන් වහන්සේට ගායනාද ගීතිකාද කරමින් අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් සියලු දේ ගැන පියවූ දෙවියන් වහන්සේට නිතරම ස්තුති කරපල්ලා. ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි බය ඇතුව එකිනෙකාට යටත්වෙයල්ලා."** (එපීස 5:18-21) ශුද්ධාත්මයාණන් වහ්නසේ, උන්වහන්සේව අපට ලබාදීම සඳහා බලපෑම් නොකරන සේක. (රෝම 5:5)

උන්වහන්සේ අප වෙතට පැමිණෙන සේක. (ක්‍රියා 8:16, 11:15) උන්වහන්සේ අප ඉදිරියෙහි පෙනෙන්නට සලස්වනු ලබන සේක. (ක්‍රියා 2:33) උන්වහන්සේ අප මත වගුරුවනු ලබන සේක. (එසතියෙල 39:29, ක්‍රියා 10:45) අපව ශුද්ධාත්මයෙන් භෞතිස්ම කරන සේක. (ක්‍රියා 11:16) ආත්මයාණන් වහන්සේ අපගේ උරුමයේ අත්තිකාරමයි. (පීස 1:14) උන්වහන්සේ තුළ අපව මුදුකර ඇත. (එපීස 1:14) දිව්‍යමය ස්වභාවය අප මත මුද්‍රාකර අපට උගන්වන සේක. (1 කොරින්ති 2:13) අපට එළිදරව් කරන සේක. (1 කොරින්ති 2:10) උන්වහන්සේ තරවටුකරන සේක. (හඟවා දෙන සේක) (යොහාන් 16:8) උන්වහන්සේ ශක්තිමත් කරන සේක. (එපීස 3:16) උන්වහන්සේ අපව ඵල වලින් පූර්ණ කරන සේක. (ගලාති 5:22) උන්වහන්සේ මනුෂ්‍යයා සමඟ සදාකල්ම විවාද නොකරන්නේය. (උත්පත්ති 6:3) උන්වහන්සේ ගැඹුරු දේ සෝදිසි කරන සේක. (1 කොරින්ති 2:10) උන්වහන්සේ පවිත්‍ර කරනු ලබන සේක. (1 කොරින්ති 6:11) උන්වහන්සේ මඟ පෙන්වන සේක. (රෝම 8:14) උන්වහන්සේ කථා කරන සේක. (1 තිමෝති 4:1, එළිදරව් 2:7) උන්වහන්සේ ගුරුකම් දෙන සේක. (නෙහෙමියා 9:20) බලයෙන් ප්‍රකාශවන සේක. (1 කොරින්ති 2:4) උන්වහන්සේ මැදහත්කම් කරන සේක. (රෝම 8:26) උන්වහන්සේ ප්‍රාණවත් කරන සේක. (රෝම 8:11) උන්වහන්සේ අන්‍ය භාෂා වලින් කතා කිරීමට පුළුවන්කම ලබාදෙන සේක. (ක්‍රියා 2:4) උන්වහන්සේ මැවුම්කරුවාණෝය. (ගීතාවලිය 104:30) උන්වහන්සේ සැනසිලිදායකයාණෝය. (යොහාන් 14:26) උන්වහන්සේ දෙවියන් වහන්සේගේ ප්‍රේමය අපගේ හදවත්වල වගුරුවනු ලබන සේක. (රෝම 5:5) උන්වහන්සේ අපව අලුත්කරන සේක. (තීතස් 3:5)

උන්වහන්සේ ශුද්ධකමේ ආත්මයාණෝය. (රෝම 1:4) ප්‍රඥාවේ සහ දැනගැන්මේ ආත්මයාණෝය. (යෙසායා 11:2, එපීස 1:17) සත්‍යතාවයේ ආත්මයාණෝය. (යොහාන් 14:17) මන්ත්‍රණයේ ආත්මයාණෝය. (යොසායා 11:2) කරුණාවේ (අනුග්‍රහයේ) ආත්මයාණෝය. (හෙබ්‍රෙව් 10:29) මහිමයේ ආත්මයාණෝය. (1 ප්‍රේත්‍රුස් 4:14) අපගේ දෙවියන් වහන්සේගේ ආත්මයාණෝය. (1 කොරින්ති 6:11) ජීවමාන දෙවියන් වහන්සේගේ ආත්මයාණෝය. (2 කොරින්ති 3:3) යහපත් ආත්මයාණෝය. (නෙහෙමියා 9:20) ක්‍රිස්තුස් වහන්සේගේ ආත්මයාණෝය. (1 ප්‍රේත්‍රුස් 1:11) පුත්‍රකම ලබාදෙන්නා වූ ආත්මයාණන් වහන්සේය. (රෝම 8:15) ජීවන හුස්ම ලබාදෙන ආත්මයාණන් වහන්සේය. (එළිදරව් 11:11) දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන්ගේ ආත්මයාණන් වහන්සේය. (ගලාති 4:6)

ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන අපව පවිත්‍රකර තිබෙන සේක. (2 තෙසලෝනික 2:13) කැලලක් නැතුව සදාකාල ආත්මයාණන් කරුණුකොටගෙන තමන්ම දෙවියන් වහන්සේට පූජාවුණා වූ ක්‍රිස්තුස් වහ්සේගේ ලෙයින් ජීවමාන දෙවියන් වහන්සේට සේවය කරන පිණිස මළ ක්‍රියාවලින් නුඹලාගේ හෘදය සාක්ෂිය කොපමණ වැඩියෙන් **පිරිසිදු කරනු නොලබන්නේද .. ? (හෙබ්‍රෙව් 14:9) දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේට දුක් නොදෙල්ලා. එක්නිසාද උන්වහන්සේ තුළ නුඹලා විඳීමේ දවසට වුදා කරනු ලැබුවහුය. (එපීස 30:4) ආත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන දෙවියන් වහන්සේගේ වාසය පිණිස අපව ගොඩනගන සේක. (එපීස 22:2) ආත්මයාණන් වහන්සේ අප තුළ වාසය කරන සේක. (2 තිමෝති 14:1) ශුද්ධාත්මයාණන් වහන්සේ, ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් බලාසිටීම උදෙසා සහ බලාපොරොත්තුවේ පවතින පිණිස අපව පූර්ණකරන සේක. (රෝම 13:15)**

මෙම ස්වර්ගීය තැනැත්තා වහන්සේව නිවැරදි ලෙස පිළිගැනීමෙන් සහ දරා සිටීමෙන් බොහෝ ශුද්ධ වූ ජීවිතයක් රදා පවත්වා ගත හැකිය. ශුද්ධාත්මයාණන් වහන්සේ සමඟ අමනාපවීම, විරුද්ධව සිටීම, දුක්කිරීම, නිවාදැමීම නොකරන ලෙස ඉල්ලා සිටින සේක. නමුත් උන්වහන්සේට ප්‍රේම කරමින් සහ උන්වහ්නසේගේ ප්‍රේමය තුළ සතුටට පත්වන ලෙස ඉල්ලා සිටින සේක. **"නුඹලා මා උදෙසා දෙවියන් වහන්සේට කරන නුඹලාගේ යාච්ඤාවලදී මා සමඟ බලවත් ලෙස වීර්යය කරන හැටියට අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නිසාද, ආත්මයාණන් වහන්සේගේ ප්‍රේමය නිසාද නුඹලාගෙන් ඉල්ලමි."** (රෝම 15:32) අපගේ ජීවිත ආත්මයාණන් වහන්සේ තුළ පැවතිය යුතුය. (ගලාති 5:25) ආත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන හැසිරිය යුතුය. (ගලාති 5:16) ආත්මයාණන් වහන්සේ තුළ යාච්ඤා කළ යුතුයි. (යුදස් 20) අප උදෙසා ක්‍රිස්තුස් වහන්සේගේ කාර්යය සහ ආත්මයාණන් වහන්සේ අප තුළ කරන කාර්යය වෙන්කොට හඳුනාගත හැකි අතර එම නිසා අපගේ නොකඩවා සමාවදීම ආරක්ෂා කර ගැනීම පිළිබඳව අවබෝධයෙන් සිටිය හැකිය. ඒ අතරම මෙම කාරණා දෙකෙන්ම වෙන්වී විවේකගත නොහැකි අතර මෙම කාරණා දෙකටම ඉඩහැරිය යුතුය. සියල්ලන් සමඟ සමාදානයෙන් සිටින්ටත්, ශුද්ධකම නැතුව කිසිවෙක් ස්වාමීන් වහන්සේ නොදක්නා බැවින් ශුද්ධකම අනුව යන්ටත් උත්සාහ කරපල්ලා. (හෙබ්‍රෙව් 12:14) ශුද්ධාත්මයාණන් වහන්සේ සමඟ සම්බන්ධතාවයට අපගේ හදවත්වල ඉඩ හැරිය යුතුය. (පිලිප්පි 2:1-2) ශුද්ධාත්මයාණන් වහන්සේගේ සහභාගිකම තුළ අපගේ ජීවිත සතුටට පත්විය යුතුය. (2 කොරින්ති 13:14)

ක්‍රිස්තුස් වහන්සේ සහ උන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේ අප තුළ සිටින සේක.

මෙම ද්විත්ව ප්‍රකාශනයේ ස්වරූපය තුළ ක්‍රිස්තුස් වහන්සේ සහ ආත්මයාණන් වහන්සේ අප තුළ වාසය කිරීම පොදු හෝ අන්‍යෝන්‍ය ලෙසින් විශේෂ අවධානයට ලක්විය යුතුය. "ක්‍රිස්තුස් වහන්සේ අප තුළ සිටින සේක." (කොලොස්සි 1:27) එය එක් පැත්තකි. අනිත් පැත්තෙන් "අපි ක්‍රිස්තුස් වහ්නසේ තුළ සිටිය යුතුය." (2 කොරින්ති 5:17, ගලාති 2:20) ශුද්ධාත්මයාණන් වහ්නසේ අප තුළ සිටින සේක. (රෝම 8:9) අනිත් පැත්තෙන් අපි ආත්මයාණන් වහන්සේ තුළ ජීවත්විය (පැවතිය) යුතුය. (ගලාති 5:25) තවදුරටත් මෙම ද්විත්ව ප්‍රකාශය මෙම විශිෂ්ඨ වචන වලද, දේවත්වයේ දී භාවිතා වේ. **"යේසුස් වහන්සේ, දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් බව යමෙක් ඒත්තු ගන්නේද, දෙවියන් වහන්සේ ඔහු තුළත්, ඔහු දෙවියන් වහන්සේ තුළත් ඇත්තේය."** (1 යොහාන් 4:15)

දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන්ගේ පුද්ගලිකභාවය සහ ක්‍රියාව පිළිබඳව දිව්‍යමය සාක්ෂි ලබා ගැනීමේ දී සම්බන්ධතාවයේ සමීපත්වය අපි ගෙන එන ඒකීයභාවය ප්‍රමාණවත් ලෙස ප්‍රකාශ කිරීමට කිසිදු දෙයකට නොහැකි බව පෙනේ. අපි ශුද්ධකමේ ජීවිතයකට කැපවී ඒ උදෙසා අවශ්‍යය සියලු දේ දරාගෙන ඒමට කැපවී සිටිනවා නොවේද ? පූර්ණ ශක්තියෙන් සහ අපගේ ජීවිතය හසුරුවා ගැනීමෙන් අපට තිබෙන්නා වූ වගකීම කුමක්ද ? **"වේ සියල්ල වෙසේ නාස්ති වෙන්ට තිබෙන බැවින් නුඹලා දෙවියන් වහන්සේගේ දවස පැමිණීම බලා සිටීමින් ද ඒ ගැන උනන්දුව ක්‍රියා කරමින් ද සියලු ආකාර ශුද්ධ වූ හැසිරීමෙහිත්, භක්තිවන්තකමෙහිත් කොයි ආකාර අයවල්ව සිටින්ට ඕනෑද ? "** (2 ප්‍රේත්‍රුස් 3:11)

අපට ඉදිරිපත් කර සහ එකතු කර ඇති මේ සියලු අපේක්ෂාවන් වන ක්‍රිස්තුස් වහන්සේගේ පැමිණීම, දේව රාජ්‍යය සහ මහිමය අපගේ ජීවිතවල ඇති අදහස්, ද්‍රව්‍ය හ උපකරණ සමඟ සෑම පැත්තකින්ම ග්‍රහණය කරගෙන ඇති බව හැගෙන්නේය. **"නුමුත් අන්ධකාරයෙන් තමන්ගේ විශ්මජනක ආලෝකයට නුඹලා කැඳවාගත් තැනැත්තාණන් වහන්සේගේ උත්කෘෂ්ඨතාවන් දක්වන පිනිස නුඹලා වනාහී තෝරාගත් වංශයක්ද, රාජකීය පූජකයෝද, ශුද්ධ වූ ජාතියක් ද, දෙවියන් වහන්සේ සන්තක සෙනඟක්ද වන්නහුය.** (1 ප්‍රේත්‍රුස් 2:9) **"උන්වහන්සේ සියලු අධර්මිෂ්ඨකම්වලින් අප මුදා, යහපත් ක්‍රියා ගැන ජ්වලිත වූ සෙනඟක් ස්වකීය සම්පතක් කොට පවිත්‍ර කරගන්න පිනිස අප උදෙසා තමන්ම දුන් සේක."** (තීතස් 2:14) **"ඉවසීම ඇතුව යහපත්කම් කිරීමෙන් මහිමයද, ගෞරවයද, අවරණභාවයද, සොයන්නන්ට සදාකාල ජීවනය දෙන සේක."** (රෝම 2:7)

අපගේ අවධානය ලබා ගැනීම

ටෝනි ඊවන්ස් විසිනි

"නුඔත් ඔවුන් තමුන්ගේ විපතේ දී ඊශ්‍රායෙල්ගේ දෙවි වූ ස්වාමීන් වහන්සේ දෙසට හැරී උන්වහන්සේ සෙවූ කළ උන්වහන්සේ ඔවුන්ට සම්බවූ සේක." (2 ලේකම් 15:4)

කොවිඩ් 19 සමඟ ඇති ගෝලීය දුෂ්කරතාවය හුදෙන් සෞඛ්‍යමය අර්බුදයකට වඩා බොහෝ වැඩි දෙයක් බව මම විශ්වාස කරමි. ඒ හේතුවෙන් ආර්ථික අර්බුදයට, දේශපාලන අර්බුදයට, මූල්‍යමය අර්බුදයට, පවුලවල අර්බුදවලට ආදී සියලුම දේවලට මුහුණ දුන්නෝය. මතුපිටින් ඇතිදේට වඩා බොහෝ ගැඹුරට එය ගමන් කරයි. පෙනෙන්නා වූ සහ භෞතික සියලුදේට කලින් නොපෙනෙන්නා වූ ආත්මික දේවල් සිදුවිය. පෙනෙන්නා වූ සහ භෞතික කාරණාවලට යොමුවීමට ඔබට අවශ්‍යය නම් නොපෙනෙන්නා වූ ආත්මික කාරණා සහ ඊට පිළියම් මොනවාදැයි ඔබ හඳුනාගත යුතුය. තවත් ආකාරයකින් පැවසුවහොත් ඔබ දකින්නේ ඔබට පෙනන සියලු දේ පමණක් නම් දැකිය යුතු සියලුම දේ ඔබට පෙනෙන්නේ නැත.

අපි අත්විදින්නා වූ මෙම බාධාවන් ආත්මිකව නැවත පිඹීමක් ගෙන ඒමට සහ අපට නැවත දෙවියන් වහ්නසේ වෙතට යොමු කිරීමට හේතුවක් වන බව මම විශ්වාස කරමි. **"ඒ කාලවලදී පිටත ගිය කෙනෙකුටවත්, ඇතුළට ආ කෙනෙකුටවත්, කිසි සමාදානයක් නැතුව දේශවල සියලු වැසියන්ට මහත් පීඩා පැවැණුනේය. ජාතියක් කරුනුකොටගෙන ජාතියක්ද, නුවරක් කරුණුකොටගෙන නුවරක්ද, පොඩි කරනු ලැබුවෝය. එක්නිසාද දෙවියන් වහන්සේ සියලු ආකාර විපත්ති වලින් ඔවුන් පෙලූ සේක."** (2 ලේකම් 15:5-6)

මෙම බයිබල් පදවල ලෝකය තුළ ඇති ව්‍යාකුලත්වය සහ පුද්ගලිකව සමාදානය නොමැතිකම විස්තර කරනු ලබයි. යුදා සහ බෙන්ජමින් ගෝත්‍රවල සෙනඟ තම නිවසට ගිය ිට නිවෙස්වල ආරවුල් පැවතුණි. නගරයක්, නගරයකටත්, ජාතියක්, ජාතියකටත් විරුද්ධව නැගී සිටියෝය. දේශය තුළ කිසිදු සමාදානයක් නොවීය.

2 ලේකම් 15:6 වන පදයේ අවසානයේ දී මෙලෙස පවසා ඇත. **"එක්නිසාද දෙවියන් වහන්සේ සියලු ආකාර විපත්ති වලින් ඔවුන් පෙලූ සේක."** මොහොතක් නතරව අවධානය යොමු කර බලන්න. මෙම ව්‍යාකුලත්වය සහ සමාදානය නොමැතිකම පිටුපස සිටින්නේ කවුද ? ස්වාමීන් වහන්සේ ඔවුන්ට දොස් පැවරූ සේක. පරණ ගිවිසුමේදී දෙවියන් වහන්සේගේ සෙනඟ උන්වහන්සේගෙන් වෙන්ව අහක්ව ගිය විට විනිශ්චය වේගයෙන් ඔවුන් පසුපස පැමිණියෝය. යේසුස් වහන්සේගේ පූජාවීමත් සමඟ ලෝකයට දෙවියන් වහන්සේ සමඟ ඇති සම්බන්ධතාවය හරිගස්වා ගැනීමට උපකාර කරන සේක. (2 කොරින්ති 5:19) යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ මරණය තුලින් ලෝකය දෙවියන් වහන්සේ සමඟ නැවත සමගි කරගන්නා බව පවසා තිබෙන සේක.

දෙවියන් වහන්සේ පරණ ගිවිසුමේදී සහ නෝවාගේ කාලයේ දී මෙන් තවදුරටත් ගින්දර, ගෙන්දගම් වසින්නට සලස්වන්නේ වත්, ජල ගැල්ම එවුවේ නැති වුවත් රෝම 1:24, 26, 28 පදවල විස්තර කරන පරිදි දෙවියන් වහන්සේ වෙන කිසිවක් නොකලත් උන්වහන්සේගේ උදහස අත්විඳීමට සලස්වන සේක. උන්වහන්සේ ඔවුන්ව අපවිත්‍රකමට පාවා දුන් බවත් එම පරිච්ඡේදයේ ඊළඟට ඔවුන්ව නීච තෘෂ්ණාවටත්, තුන්වෙනුව ඔවුන්ට ජඩ (දූෂිත) සිතකට පාවා දුන් බවත් ශුද්ධ ලියවිල්ලේ සඳහන් වේ. මක්නිසාද දෙවියන් වහන්සේගේ සෙනඟ තවදුරටත් උන්වහන්සේව වඩා ඕනෑකිමන් නොසලකා හැර, උන්වහන්සේට අගෞරව කර ඉවත්ව යාමට තීරණය කර තිබුණෝය. එම නිසා ඔවුන්ගේ හැසිරීම්වල ප්‍රතිඵලයට සහ උන්වහන්සේගේ නියමය ලෙස ජීවිතයට සපයා දෙන කාරණා දෙස බලා නෙසිටීමේ ප්‍රතිඵලය අත්විඳීමට ඉඩ හරිනු ලැබූ සේක.

පුද්ගලිකව පවුල් වශයෙන් සභාවන් හෝ ජාතීන් වශයෙන් ඔවුන් දෙවියන් වහන්සේගෙ න් ඉවත්ව යාමෙන් සිදුවන්නේ කුමක්දැයි රෝම 1:21-24 දක්වා පදවල විස්තර කරනු ලබන්නෝය. **"එක්නිසාද ඔවුහු දෙවියන් වහන්සේ ඇඳිනගත් උන්වහන්සේට දෙවියන් වහන්සේ මෙන් ගෞරවයවත්. ස්තුතිවත් නොකොට, තමනුගේ චිතර්ක වලින්, නිරර්ථක බවට පැවුණුණේය. ඔවුන්ගේ අඥාන සිත්ද අඳුරු විය. තුමුම ප්‍රඥාවන්තයෝ යයි කියමින් ඔවුහු අඥානයෝව, ජරාවට නොපැමිණෙන්නා වූ දෙවියන් වහන්සේගේ මහිමය ජරාවට පැමිණෙන්නා වූ මනුෂ්‍යයාගේද, පක්ෂීන් හා සිවුපාවුන්ගේද, බඩගායන ජාතීන්ගේ ද රූපවලට සමාන වන ලෙස මාරු කළෝය. එබැවින් ඔවුන් තම තමුන්ගේ සිත්වල තෘෂ්ණා කරුණුකොටගෙන තමුන්ගේ ශරීරවලට අවමාන කරගන්නා හැටියට දෙවියන් වහන්සේ ඔවුන් අපවිත්‍රකමට පාවා දුන් සේක. "** (රෝම 1:21-24)

17 වන ශත වර්ෂයේ දී ප්‍රංශයේ සිටියා වූ ශ්‍රේෂ්ඨ ගණිතඥයෙක්, භෞතික විද්‍යාඥයෙක්, දර්ශනවාදියෙක්, දේව ධර්මාචාර්යවරයෙක් වූ " බ්ලෝස් පැස්කල් " මෙම අනතුරුදායක අවස්ථාවේ දී සියලුදෙනාම කිසිවක් හැගෙන්නේ නැති තත්ත්වයක සිටින බව හඳුනා ගත්තේය. ඔහු තීක්ෂණ බුද්ධිය කරුණුකොටගෙන සොයා ගත්දේ සාරාංශ කර ඇත්තේ මනුෂ්‍යයාගේ හදවතේ දෙවියන් වහන්සේගේ ස්වභාවය නොතිබීම මැවිල්ලේ වෙන කිසිම දෙයකින් සෑහීමකට පත්කළ නොහැකි අතර එම ස්වභාවය සම්පූර්ණ කළ හැකි වන්නේ මැවුම්කරුවාණන්ට පමණක් බවත්, එය යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුලින් අවබෝධ කර දී ඇති බවත්ය.

මනුෂ්‍යයාගේ සිත තුළ හෝ ජාතියේ සෙනඟගේ හදවත් වලින් දෙවියන් වහන්සේ වෙතින් මුලාව යාමෙන් හැරී එන විට පෙර සිටියා වූ තත්ත්වයට පත්විය හැකිය. දැඩි පිළිකුල් තත්ත්වයට පත්ව සිටි ස්වභාවයෙන් හැරී එන විට හිස්ව තිබෙන්නා වූ ස්වභාවය වේගයෙන් පහව ගොස් දෙවියන් වහන්සේගේ ස්වභාවයෙන් පූර්ණ වන්නේය. මේ තීරණාත්මක මොහොතේ දෙවියන් වහන්සේ වෙතින් ඈත්ව සිටීමේ අත්දැකීම රෝම පොතේ සඳහන්ව ඇති කාලයේ මෙන්ම නිශ්චිතවම පවතින බව යෝජනා කිරීමට කැමැත්තෙමි. දෙවියන් වහන්සේ වෙතින් ඈත්ව යාම හේතුවෙන් ගෝලීය වශයෙන් හදිස්සියේ ඇතිවන බෙදවාචකයන්, කැලඹීම්, කාංසාව, භය, රෝගී බව වැනි කාරණා වලින් ක්ෂණිකවම පිරී යනු ඇත.

දෙවියන් වහන්සේ සර්වාසී බව අපි දනිමු. නමුත් මම කථා කරන්නේ දෙවියන් වහන්සේගේ සම්බන්ධතාවය නැතිකමේ හේතුව පිළිබඳවයි. ඒක හරියට ඔබ වහන්සේට මාව එපා නම්, මම නැති තත්වය මොනවගේද කියලා ඔබවහන්සේට බලන්න වෙනවා කියලා කියනවා වගෙයි. එම නිසා දෙවියන් වහන්සේම සෑම තත්ත්වයකම දේවල්වල සාමාන්‍ය, ස්වභාවික සහ කැමති පිලිවෙලවලට බාධා පැමිණෙන්නට ඉඩ හරින බව මම විශ්වාස කරමි. දෙවියන් වහන්සේ ලොව වඩා පණිවිඩය යවන සේක. පරණ ගිවිසුමේ 2 ලේකම් 15:3 වන පදයේ සඳහන් සිදුවීම වෙතට නැවත අවධානය යොමු කර එම තීරණාත්මක සහ ව්‍යාකුල අවස්ථාව ගැන කථා කරමු. බොහෝ කාලයක සිට ඊශ්‍රායෙල්වරු සැබෑ වූ දෙවියන් වහන්සේද, උගන්වන පූජකයෙන්ද, ව්‍යවස්ථාවද නැතුව සිටියෝය. (2 ලේකම් 15:3)

සැබෑ දෙවියන් වහන්සේ නැතුව

අසරියා අනාගතවකතෘ පවසන්නේ දෙවියන් නැහැ කියා නොව, නමුත් සැබෑ දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසයක් නැතිව සිටින බව ඔහු පැවසුවේය. ඊශ්‍රායෙල් සෙනඟ සැබෑ දෙවියන් වහන්සේ වෙනුවට රූපවලට නමස්කාර කළෝය. එම රූප සාමාන්‍යයෙන් රන් වලින් නිර්මාණය කරනු ලැබුවාවූ ඒවා නොවේ. ඕනෑම පුද්ගලයෙක්, ස්ථානයක්, ඕනෑම දෙයක් හෝ ඕනෑම සිතුවිල්ලක් දෙවියන් වහන්සේගේ ස්ථානය ගත්තේය. මුළු බයිබලයේම විශාල ලෙස පැතිරී තිබෙන පාපය රූප නමස්කාරයයි. මක්නිසාද ඔබ දෙවියන් වහන්සේගේ විශිෂ්ඨ ගුණය ඉවත්කර දමා තිබෙන නිසා රූප නමස්කාරයට විරුද්දවීමට කිසිවෙක් නොමැත. රූප නමස්කාරය සූක්ෂමව පැමිණිය හැකිය. එය රන් වස්සෙක් ලෙස හෝ අන්‍යජාතීන් නමස්කාර කළ කුළුණක් ලෙස නොතිබීමට පුළුවන. තාක්ෂණික විද්‍යාව, මුදල්, මනුෂ්‍යය සම්බන්ධතාවයන්, මේ ඕනෑම දෙයක් දෙවියන් වහන්සේගේ ස්ථානය ගත හැකිය. දේශපාලනය හෝ ලිංගිකත්වය රූප නමස්කාරයක් ලෙස පැවතිය හැකිය. වෘත්තීය හෝ අධ්‍යාපනය රූප නමස්කාරයට හැරීමට පුළුවන. පවුල හෝ ආගම වුවත් රූප නමස්කාරය විය හැකිය.

ඒවා එක් පැත්තකින් දෙවියන් වහන්සේගේ ස්ථානය ගෙන තිබෙනවා හෝ එසේ නැති නම් දෙවියන් වහන්සේම උන්වහන්ව එළිදරව් කර තිබෙන උවන්වහන්සේගේ ස්වභාවය ප්‍රතික්ෂේප කිරීම කරුණුකොටගෙන විවෘත වී තිබෙන හිඩැසට මෙම දූෂිත වූ කාරණා අතුල් විය හැකිය.

ව්‍යවස්ථාව උග්නවන පූජකයෙක් නැතිව

දෙවියන් වහන්සේගේ සත්‍යතාවය ස්ථීර ලෙස මනුෂ්‍යයන්ට පෙන්වාදීමට පාලකරුවන් සහ නායකයන් අසාර්ථකව සිටින විට එහි ප්‍රතිඵලය ලෙස සංස්කෘතිය ව්‍යාකුල තත්වයට පත්වී සමාජය පිරිහීමට ලක්වන්නෝය. බොහෝ සභාවන් සංස්කෘතියට අවනතවීම තුළ සහ දෙවියන් වහන්සේගේ වචනය ප්‍රතික්ෂේප කිරීම කරුණුකොටගෙන උන්වහන්සේගේ දෙවත්වය ප්‍රකාශ නොකර නිහඬව සිටිති. අපි සත්‍යතාවය මග හැරීම පිළිබඳව සමාව ගැනීම දැඩිව උන්වහන්සේ ගැන අපි සිතන දේ නැති නම් මනුෂ්‍යයන්ට යහපත් යැයි හැගෙන දේ අපි උගන්වන්නෙමු. ජනප්‍රියව තිබෙන දේ සහ වැඩි මනාපයක් ඇති දේ කුමක්ද ? අපි ඒවා උගන්වන්නෙමු.

මෙහිදී සෑම ප්‍රශ්නයකටම පිළිතුරු දෙකක් තිබේ. දෙවියන් වහන්සේගේ පිළිතුර සහ සියලුදෙනාගේ පිළිතුරයි. එමෙන්ම දෙවියන් වහන්සේ ප්‍රකාශ කර තිබෙන දේ ගොතගගහා (සැක සහිතව)

7 පිටුවට

6 පිටවෙන්

අපගේ අවධානය ලබා...

කථා කරන්නේ නැත. ඊට අමතරව මනුෂ්‍යයන් වැරදි දේ ප්‍රකාශ කරයි. උන්වහන්සේගේ වචනය සම්පූර්ණව, සකාකාලයටම සරිලන පරිදි ජීවිතයට අදාළව සහ සියලු කාරණාවලට අදාළව ප්‍රකාශ කර ඇත. දෙවියන් වහන්සේ විවාහය පිළිබඳව **නිර්වචනය කර තිබෙන සේක. දෙවියන් වහන්**සේ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳව විස්තර කර තිබෙන සේක. දෙවියන් වහන්සේ සියලු දේවල අනන්‍යාවය අර්ථ දක්වා තිබෙන සේක. දෙමව්පියන් සහ දරුවන්ගේ ප්‍රතිචාරය කෙසේ තිබිය යුතු දැයි විස්තර කර තිබෙන සේක. දේව ධර්මය සහ සභාව එය පරිහරණය කළ යුතු අන්දම විස්තර කර තිබෙන සේක. උන්වහන්සේ මැවූ දේවල් සහ රාජ්‍යාන් පැවතිය යුතු ආකාරය විස්තර කර තිබෙන සේක. අපි මේ ආකාරයේ දේවල උත්පාදනය සහ පැවැත්ම නැවත විස්තර කිරීමට (අර්ථ දැක්වීමට) යාමේ ප්‍රතිඵලය වියවුල්කම ඇතිවීමයි.

අපි අපගේම නීති හදාගැනීමෙන් සහ ඒ අනුව මැන බැලීමෙන් දෙවියන් වහන්සේට නිග්‍රහ කරන්නෙමු. එවිට එම දේශය තුළ සැබෑ වචනය උගන්වන පූජකයෙක් නැතිවන්නේය. දෙවියන් වහන්සේ පවසා තිබෙන්නා වූ තත්ත්වයට නොපැමිණ සමාජයේ වුවමනාවට දේශනා කුඩුව තුළ ඉඩහැර ඇත්තෙමු. මනුෂ්‍යයන්ට ඔවුන්ගේම ස්වභාවයන් මත සැනසිල්ල ඇතිව සිටීමට පමණක් අපි ඔවුන්ව පිළියෙල කරන්නෙමු. ධර්මිෂ්ඨකමේ සහ සාධාරණත්වයේ කාරණා දෙවියන් වහන්සේ ප්‍රකාශ කරන සෙක. එමෙන්ම දිළින්දන්ට උපකාර කරන්නේ කෙසේද? සාධාරණත්වය ක්‍රියාවේ යොදවන්නේ කෙසේද ..? ආර්ථික ස්ථාවරත්වය සහ පුද්ගලික ආර්තිකය ගොඩනගන්නේ කෙසේද ? කියා දෙවියන් වහන්සේ පවසා තිබෙන සේක. සමාජය තුළ පවතින සියලු චින්තනයන් මත ප්‍රේමය සමඟ දෙවියන් වහන්සේගේ වචනයේ සත්‍යතාවය පැහැදිලිව ඉගැන්වීම පූජකයන්ගේ සේවයයි.

වර්තමානයේ පවතින සියලුම කාරණාවලට අදාළව දෙවියන් වහන්සේගේ වචනයේ සත්‍යතාවය යෝග්‍යව තිබේ. එමෙන්ම සියලු මනුෂ්‍යයන් සහතික කිරීමට සහ සියලු සැලසුම් හරිගැස්වීමට දේව වචනය යෝග්‍ය වේ. දේශපාලනය, සමාජීය වාතාවරණය, ආර්ථික තත්ත්වය කොයිතරම් උසස් හෝ පහත් වුවත් ඒ ගැන සැලකිල්ලට නොගෙන (කල්පනා කරමින් නොසිට) සංස්කෘතියට ප්‍රමාණය ඉක්මවා ගෞරවය ලබා නොදී පූජකයා ඉගැන්විය යුතුය. නායකයන් ආත්මික ආධිපත්‍යය ඇතිව සහ ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය ඇතිව කථා කළ යුතුය. දෙවියන් වහන්සේගේ සත්‍යතාවය මනුෂ්‍යයන්ට කථා කිරීම උදෙසා සැලකිලිමත්වීමට සහ දෙවියන් වහන්සේගේ ප්‍රේමය උදෙසා සැලකිලිමත්වීම දැක්වීම දෙවියන් වහන්සේගේ සේවකයන්ගේ හොඳම ක්‍රියා මාර්ග යයි. සමාජීය මතයන් නිෂ්ප්‍රභා කර හෝ පාරම්පරික සම්ප්‍රදායෙන් උගන්වා තිබෙන දේ නිෂ්ප්‍රභා කර දෙවියන් වහන්සේගේ වචනයේ සත්‍යතාවය දේශනා කුඩුවේ සිට දේශනා කළ යුතුය. මහාචාර්යවරු හෝ දේශපාලනඥයන් ප්‍රකාශ කර තිබෙන දේවල අධිකාරී බලයට වඩා ඉහළින් තිබෙන දේව වචනය ප්‍රකාශ කළ යුතුය. මාධ්‍ය තුලින් ප්‍රවර්ධනය කිරීමට උත්සාහ දරණ බලපෑමට ඉහළින් දේව වචනය පැවසිය යුතුය. හුරුබුහුටි කෙටි අනුශාසනාවලට හෝ සිත් ඇදගන්නා වූ කිතුණු ප්‍රකාශයන්වලට වැය කිරීමට අපට තවත් කාලයක් නොමැත. නිදොස් බවට කරුණු පැහැදිලි කරමින් සිටින්නේ නැතිව දෙවියන් වහන්සේගේ වචනයේ අනුග්‍රහය සමඟ සම්පූර්ණ උපදේශනය ලබා දෙමින් දේශනා කිරීමට කාලය පැමිණ ඇත.

දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාව නැතුව සිටියෝය

අවසාන වශයෙන් 2 ලේකම් 15:3 වන පදයේ ව්‍යවස්ථාව නැතිව සිටි බව පවසා ඇත. තවත් ආකාරයකින් පවසන්නේ නම් ඔවුන්ගේ ක්‍රියාවන් පාලනය කිරීමට (හැසිරවීමට) මනුෂ්‍යයන්ට මඟපෙන්වීමක් තිබුණේ නැත. එය වර්තමානයේ දී ඔබ ඔබගේම කැමැත්තට ගෞරව කිරීමට ධෛර්යය ලබාදීමට සමානව තිබේ. මම සිතන්නේ මෙයයි. මට හැගෙන්නේ මෙයයි. මම විශ්වාස කරන්නේ මෙයයි. එම නිසා මෙය මගේ සත්‍යතාවයයි කියන්නාක් මෙන් වේ.

නමුත් අපගේ සත්‍යතාවය, දෙවියන් වහන්සේගේ සත්‍යතාවයට පටහැනි නොවිය යුතුය. අපි එසේ කරන්නේ නම් අපි දෙවියන් වහන්සේව බොරුකාරයෙක් කරන්නෙමු. අපි අපගේ සිතුවිලි, යෝජනාවන් සහ ප්‍රඥාව උන්වහන්සේගේ සත්‍යතාවයට වඩා උසස් කරන්නෙමු. වෙනත් දෙවිවරුන්ගේ යෝජනාවන්, ව්‍යාකුලත්වය උසස් කරන විට සියලු ආකාරයේ කරදර කරුණුකොටගෙන මනුෂ්‍යයන් විපත්තියට හසුවන්නෝය.

දෙවියන් වහන්සේ වෙතට හැරී උන්වහන්සේව සොයන්න.

2 ලේකම් 15:4 වන පදයේ පිළියමක් සාදා දී තිබෙන නිසා දෙවියන් වහන්සේට ස්තුති වේවා. **“නමුත් ඔවුන් තමුන්ගේ විපතේ දී ඊශ්‍රායෙල්ගේ දෙවි වූ ස්වාමීන් වහන්සේ දෙසට හැරී උන්වහන්සේ සෙවූ කළ උන්වහන්සේ ඔවුන්ට සම්බවූ සේක.”** (2 ලේකම් 15:4) ඔහු එය දුටුවාද ? “තමුන්ගේ විපතේ දී..” එමෙන්ම ඔවුන්ව සියලු ආකාරයේ විපත්ති වලින් පෙළෙන්නට සැලැස්වූයේ දෙවියන් වහන්සේ බව 2 ලේකම් 16:6 වන පදයෙන් අපි අවබෝධ කරගන්නෙමු. අපි අපගේ අවධානය වෙනත් දේවලට යොමු කර තිබෙන තෙක් දෙවියන් වහ්සේ ව්‍යාකුලත්වය ඇතිවීමට ඉඩහරින සේක. එසේ සිදුවන්නේ දෙවියන් වහන්සේ නපුරු නිසා නොවේ. නමුත් අපි අපගේමුළු හදවතින්ම උන්වහන්සේට පක්ෂපාතිවීමට උන්වහන්සේ ආශා කරන සේක. සමහර අවස්ථාවලදී අපි අපේ දරුවන් අවධානය යොමු කරන තෙක් කරදර කරනවා නේද ..? ඊශ්‍රායෙල්ගේ දෙවියන් වහන්සේ ඔවුන් උන්වහන්සේව සොයමින් උන්වහන්සේ වෙතට හැරී එන තෙක් ව්‍යාකුලත්වය ඔවුන් තුළ ඇති කරන සේක.

ප්‍රශ්නය වන්නේ අපි උන්වහන්සේව සොයන්නේ කෙසේද .. ? ඔබ උන්වහන්සේ සමඟ සම්බන්ධතාවය ඇතිව උන්වහන්සේව අනුග මනය කරන අතර උන්වහන්සේගේ ආධිපත්‍යයට යටත්විය යුතුය. ඊශ්‍රායෙල් සෙනඟ මෙන් උන්වහන්සේව සෙවීමට ඉඩ ලබාදෙන්න. දෙවියන් වහන්සේගේ ආශාව උන්වහන්සේගේ සෙනඟ සමඟ සම්බන්ධතාවය පැවැත්වීමට වන සේක. උන්වහන්සේව දැන ගැනීම ඔබගේ ඉලක්කය කරගන්න. මෙය කළ හැකි වන්නේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරුණුකොටගෙන පමණි. උන්වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය. උන්වහන්සේ සම්පූර්ණ ජීවිතයක් ගත කළ සේක. ඉන්පසුව උන්වහන්සේගේ මරණය තුළ ඔබගේ ස්ථානය ගෙන, ඔබගේ පාපය උදෙසා ජීවිතය පූජා කරමින් සදාකාල ජීවනය උරුමකර දුන් සේක. පියාණන් වහන්සේ සමඟ ඔබව සම්බන්ධ කළ සේක.

යම් කෙනෙක් ක්‍රිස්තුස් වහන්සේ වෙතට පැමිණ තමාගේ පාපයට සමාව ලබාගන්නා විට නොමිලේම සදාකාල ජීවනය ත්‍යාගයක් ලෙස ලබාදෙන සේක. ඔබගේම උත්සාහයෙන් එය ලබාගත නොහැකිය. උන්වහන්සේ එය ලබාදෙන සේක. ඔබ දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධතාවය වර්ධනය කරගන්නා විට දෙවියන් වහන්සේගේ සමාදානය මත රැඳෙන පිණිස උන්වහන්සේ අපට පවසා අපගේ ප්‍රශ්නය නිරාකරණය කරන සේක. ව්‍යාකුල අවස්ථාවන් තුළ අපගේ උපකාරය, රැකවරණය සහ ශක්තිය උන්වහන්සේ බව ගීතාවලිය 46, වන ගීතිකාවේ සඳහන් කර ඇත. ඔබට සැනසිල්ල නැති තාක් ඔබ ඔබගේම පැත්තේ සිටින බවත්. ඔබ උන්වහන්සේට ඇලුම්වන්නේ නැති බවත් දෙවියන් වහන්සේ දන්නා සේක.

ඔබගේ ජීවිතයේ සහ මාගේ ජීවිතයේ ව්‍යාකුල තත්වයන් වලට දෙවියන් වහන්ස් ඉඩහැර තිබෙන බව මම විශ්වාස කරමි. මක්නිසාද අපි උන්වහන්සේට සමීපවීම උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක. දැන් උන්වහන්සේ වෙතට දිවීමට, උන්වහන්සේව සෙවීමට, උන්වහන්සේව අනුගමනය කිරීමට, උන්වහන්සේ වෙත අතිශය උද්යෝගිමත්වීමට, දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් තුළ උන්වහන්සේව දැන ගැනමට කාලයයි. උන්වහන්සේගේ වචනය වැළඳගෙන සහ උන්වහන්සේට ඔබගේ කැපවීම වර්ධනය කරගන්න. ඊළඟට ඔබට හැගුණත් නැතත් උන්වහන්සේගේ වචනයට අවනත වෙන්න. අපගේ හැඟීම් අපව මෙහෙයවන එන්ජිම නොවේ.

දෙවියන් වහන්සේ අපටත්, අපගේ පවුල්වලටත් ආශිර්වාද කරන සේක. අපගේ සංස්කෘතිය ලෙස අපි දෙවියන් වහන්සේව අවබෝධකර ගැනීම හේතුවෙන් අපි උන්වහන්සේ වෙතට හැරී එනවිට උන්වහන්සේ ව්‍යාකුලත්වයෙන් සහනය ලබාදෙන සේක.

දෙවියන් වහන්සේගේ විශ්වාසවන්ත තරවටු කිරීම.

දෙවියන් වහන්සේ මාගේ සිත ප්‍රබෝධ කරන ලෙසත්, ඔබවහන්සේ පිළිකුල් දේවලට අතගැසීමට මට ඉඩ නොදෙන ලෙසත් මම යාච්ඤා කරමි. මම මාගේ වැදගත් නොවන පුරුදුවල වර්ධනය වී සිටිමි. මගේ නපුරු මාර්ග වලින් හැරෙන පිණිස සහ ඔබවහන්සේව සතුටු කරන පිණිස මට තරවටු කළ මැනව. මා වටා සිටින ලෝකයේ අයව සතුටු කිරීම පිළිබඳව සැලකිල්ල නොදක්වා ක්‍රිස්තුස් වහන්සේ පමණක් මා තුළ සිටින පිණිසත් යාච්ඤා කරමි. ඔබවහන්සේගේ ආශිර්වාදලත් වචනය කරුණුකොටගෙන මාව සෝදිසි කිරීමට මම යටහත් වන්නෙමි. කෙලින් සහ නිශ්චිත ලෙස ගමන් කරන පිණිස ඔබ වහන්සේගේ විනිශ්චයන් වැළඳ ගැනීමට යටහත් වන්නෙමි. යේසුස් වහන්සේගේ නාමයෙන් ..., ආමේන් ...

විනිශ්චය දෙවියන් වහන්සේගේ ගෘහයෙන් ආරම්භ වන බව බයිබලයේ අපට පවසා ඇත.

ඒ.ඩබ්. ටෝසර් විසිනි (1897-1963)

දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ ගිවිසුමේ සෙනඟ සමඟ ප්‍රථමයෙන් කටයුතු කරන සේක. දෙවියන් වහන්සේගේ දයාවන්ත වූ ක්‍රියා කිරීමෙන් සමහර විට අපට තරවටු කර පාපයේ ඛේදවාදකයෙන් අපව හරවා ගන්නා සේක.

8 පිටුවට

Reg. No: DOP/NEWS/21/2023
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

7 පිටවෙන්

දෙවියන් වහන්සේගේ...

විනිශ්චය පැමිණෙන විටදී වුවත් සැනසිල්ල ලබා ගැනීම උදෙසා බලා සිටීමට එය අප වෙනුවෙන් අව්‍යාජව තිබේ. සමහර මනුෂ්‍යයන් කියන්නේ ඔවුන් ලබන්නට සුදුසුව තිබෙන්නේ මොනවාද ඒ සියලු දේ ඔවුන් ලබන බවයි. නිශ්චිතවම මට නම් මම ලබන්නට සුදුසුව තිබෙන දේ ලැබීමට මට අවශ්‍ය නොවේ. මක්නිසාද මම ලැබීමට සුදුසුව තිබෙන දේ නිරය බව මම දනිමි. දෙවියන් වහන්සේගේ දයාවන්ත වූ තරවටු කිරීම කරුණුකොටගෙන නිරයේ ගින්නේ සහ නිරයේ ශාපයේ මාර්ග වලින් මාව හරවා ගන්නවාට මම කැමැත්තෙමි.

එබැවින් මම ලබන්නට සුදුසුව තිබෙන දේ ලැබීමට මට උවමනා නැත. දෙවියන් වහන්සේගේ කරුණාව (දයාව) මත මාගේ ජීවිතය තැබීමට මට අවශ්‍යව තිබේ. දෙවියන් වහන්සේගේ මහත් වූ දයාව කැණාව තුළ ඇති අංගයක් ලෙස උන්වහන්සේගේ විශ්වාසනීය වූ තරවටු කිරීම හරහා මගේ හිතුවක්කාර මාර්ග වලින් මාව හරවා ගැනීම මට අවශ්‍යව තිබේ.

මක්නිසාද මම දෙවියන් වහන්සේගේ ගිවිසුමේ සෙනගට පංගුකාරත්වය දරන අතර, සැකයක් නැතිව දුෂ්ඨකමේ අප්‍රසන්න බව අනාවරණය යටතේ සිටින බැවින් උන්වහන්සේගේ අනතුරු ඇඟවීම යටතේ සහ උන්වහන්සේගේ තරවටු කිරීම යටතේ සිටින්නෙමු. දෙවියන් වහ්නසේ, උන්වහන්සේ තුළ අපගේ ශුද්ධකම පවත්වාගෙන යාම සඳහා කළ හැකි සැමදේම ඉටුකරන සේක. දෙවියන් වහන්සේ මගේ ජීවිතයේ උන්වහන්සේට විරුද්ධව තිබෙන්නා වූ සියලු මුල් උගුලා දැමීමට කාර්ය බහුලව ක්‍රියා කරමින් සිටින සේක. දෙවියන් වහන්සේගේ තරවටු කිරීම නොසලකා හරිමින් උන්වහන්සේගේ සැනසිල්ල තුළට රිංගා ගැනීමට උත්සාහ දැරීම මෝඩකමකි. ඕනෑම ප්‍රමාණයේ පාපයක් දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කරන සේක. උන්වහන්සේගේ ශුද්ධ ස්වභාවයට පටහැනි අප තුළ පවතින දේවල් උන්වහන්සේගේ කරුණාවන්ත අවධානය යටතේ තරවටු කර විනිශ්චය කරන සේක.

මුළු කිතුණු ලෝකය තුළ අපගේ ගිවිසුමේ සම්බන්ධතාවය පිළිබඳව පාරට්ටු කර ගන්නෙමු. අප සියලුදෙනාම හොඳින් සිටින බව සහතිකවීම සඳහා අපි දැඩි ආශාවෙන් බලා සිටින්නෙමු. නමුත් කාරණයේ සත්‍යතාවය නම් එළිදරව් කර තිබෙන ආලෝකයට විරුද්දව අපි පව්කර ඇති බවයි. අපි දෙවියන් වහන්සේගේ ආලෝකයට විරුද්ධව කැරළිගසන විට අපගේ වාතාවරණය ඉතා දුෂ්ඨව තිබේ. අප වටා තිබෙන අන්ධකාරය තුළ පැකිලෙන තරමට නොව අපි ආලෝකයේ දරුවන් බව ප්‍රකාශ කිරීමට අදහස් කරන තරමට එසේ වන්නේය. අපගේ වාතාවරණයේ (තත්වයේ) ඛේදවාචකය එයයි.

අපගේ පරම්පරාව තුළ විනිශ්චය

අපි දේවස්ථානය දෙස බලන්නේ නම් සහ දේවස්ථානය තුළ ඇති ක්‍රියාවන් සහ සමකාලීන සමාජය දෙස බලන්නේ නම්, අපි එහි දකින දේ දෙවියන් වහ්නසේගේ ජීවමාන වචනය සමඟ සසඳා නොගැලපෙන සොයාගත හොත් විනිශ්චය පැමිණීම අවශ්‍යය බව පෙනෙන්නේය. තෝරා ගැනීම අපගේය. අපි අපගේම ජීවිත විනිශ්චය කරගෙන සහ අධර්මිෂ්ඨකම සමඟ ඇති අපගේ සහභාගීකම පිළිබඳව හෝ දෙවියන් වහන්සේ අප වෙත විනිශ්චය එවීම පිළිබඳව කටයුතු කළ යුතුය. මට නිශ්චිතවම වෙන කෙනෙකු විනිශ්චය කිරීමට අවශ්‍යය නොවේ. නමුත් අපේ රටේ කිතුනුවන් දෙවියන් වහන්සේගේ විනිශ්චය යටතේ සිටින බව පෙනෙන්නට ඇත.

යම් කෙනෙකුට තවත් කෙනෙකුගේ පාපය සොයාගෙන එය පෙන්වා ඔහුගේ හෝ ඇයගේ පාපය ගැන අප්‍රසාදය ඵල කිරීම පහසුය. නමුත් අපි අපගේම ජීවිත ඇගයීමකට ලක් කිරීම ආරම්භ කළ යුතුය. දෙවියන් වහන්සේගේ වචනය කරුණුකොටගෙන තරවටු කිරීමට අවශ්‍ය වන්නා වූ මා තුළ ඇති කාරණා මොනවාද ..? එහිදී අසීමිත ලෙස වටේ සිටින්නා වූ සියල්ලන්ට වරද පටවනවා පෙනෙන අතර පසුතැවිලි වෙනවා පෙනෙන්නේ ස්වල්ප වශයෙන් බව සොයාගත හැකිය.

අප **ජීවත්වන්නේ** තරවටු නොලැබුවා වූ පරම්පරාවක බව මම විශ්වාස කරමි. බොහෝ කාලයකට කලින් ලෝකයේ පිටත සිටියදී පවා පාපය මත සෝදිසි කරනු ලැබුවා වූ කාලයක් තිබුණි. ඒ කාලයේ දී පුද්ගලිකව, සමාජයක් වශයෙන් සහ ජාතියක් වශයෙන් නිශ්චිතවම ලැජ්ජාවට පත්වෙන කාරනාවන් තිබුණි. අප පැමිණ තිබෙන්නා වූ මේ පරම්පරාව කිසිවක් පිළිබඳව ලැජ්ජාවට පත්වන්නේ නැත.

මේ පරම්පරා අතරේ **වනුෂයයන් බොහෝ දෙනා තදින් හික්**මවන්නේ නැති, අහංකාර, ගරුසරු නැති, අයව සිටිති. සෑමදෙනාම තමන්ගේම ඇස්වලට හරිව පෙනෙන දේ කරති. කවුරු අකමැති වුවද ඔබ කැමති දේ ඔබ කරන්න යනු මේ පරම්පරාවේ අදහසයි.

දෙවියන් වහන්සේගේ ගිවිසුමේ සෙනගගේ කාර්යභාරය

දැන් මම විස්තර කර තිබෙන සියලු දේ දෙවියන් වහන්සේගේ ගිවිසුමේ ජනතාව ලෙස හඳුන්වනු ලබන අය වටා සිදුවෙමින් පවතියි. ක්‍රිස්තුස් වහන්සේගේ සභාව මේ ලෝකය තුළ බලපෑම් ඇති කිරීම අහිමිව සිටිනවාද .. ? සංස්කෘතියේ පාපිෂ්ඨ ක්‍රියා මාර්ග පිළිබඳව අපි බොහෝ කාලයක් තරවටු නොලැබ සිටිනවාද ..? දෙවියන් වහන්සේගේ ගිවිසුමේ සෙනගගේ ලක්ෂණය නම් ඔවුන් පාපයට අයිතිව සිටි අතර දැන් එය අත්හැර දමා තිබීමයි. ඔවුන් දෙවියන් වහන්සේගේ තරවටු කිරීම අත්දකිමින් සහ විනාශයේ ගමන් මාර්ගයේ පැවතීමෙන් හැර එන්නෝය. අපි පාපයේ ගමන් මාර්ගයෙන් හැරී ශුද්ධකමේ ගමන් මාර්ගයේ ගමන් කරන්නෙමු. එම ගමන් මාර්ගය පිළිබඳව ශුද්ධ ලියවිල්ලේ මෙලෙස පවසා ඇත. **"මක්නිසාද ජීවනයට යන දොරටුව පටුය. පාර අවහිරය. ඒක සම්බන්ධවන්නේ ස්වල්ප දෙනෙකුටය."** (මතවේ 7:14) අද ක්‍රියාත්මක වන්නා වූ කිතුණු මතවාදය කිසිම කෙනෙකුට අපායට යා නොහැකි තරමට පුළුල් වී ඇත. කළ යුතු වන්නේ කුමක්ද ?

අපි අපගේ කීර්තිමත් අතීතය තුළ විශ්වාසය තැබීමට ධෛර්යමත් (නිර්භීත) වන්නේ නැත. බොහේ දෙනා අතීතය පෙන්වාදීමටත්, එය ඔවුන්ගේ උරුමය බව පෙන්වා දී සැනසීමටත් කැමැත්ත ඇතිව සිටින්නෝය. මම පෙන්වා දෙන්නේ අතීතයේ දී සිදු වූ දේ වර්තමානයේ දී ප්‍රතිනිර්මාණය නොවන්නේ නම් එයින් අපට කිසිදු බලපෑමක් නොවන බවයි. දෙවියන් වහන්සේගේ ගිවිසුමේ සෙනඟ ලෙස අපගේ ජීවිත රැගෙන ඒමට ක්‍රියා කිරීම වශයෙන් අදහස් කරන්නේ එයයි. අතීතයේ ජීවත් වූ අය සමගම අතීතය මිය යයි. එමනිසා අපට අතීතයේ ජීවත් විය නොහැකිය. එමෙන්ම අතීතයේ ශ්‍රේෂ්ඨත්වයේ සෙවණැල්ල තුළ අපට ජීවත්විය නොහැකිය.

අපි තේජාන්විත වර්තමානයක් නිර්මාණය කිරීමට කැමැත්තෙන් සිටින්නේ නම් මිස තේජාන්විත අනාගතයක් දෙස බැලීමට එඩිතර නොවෙමු. අපගේ ජීවිතවල එසේ කිරීම යනුවෙන් අදහස් කරන්නේ දෙවියන් වහන්සේගේ ගිවිසුමේ සෙනඟ ලෙස දැන් අපව දෙවියන් වහන්සේගේ යලි සෝදිසි කිරීමට සහ විනිශ්චය යටතට ගෙන ඒමයි.

එයින් අදහස් කරන්නේ අපගේ ගැලවීම ගැන සෝදිසි කිරීම සහ අප තුළ සහ අප තුළින් දෙවියන් වහ්සේට කරන්නට කැමති දෙයට ඉඩ හැරීමයි. අපි විනිශ්චය දවස පැමිණෙන තෙක් බලා සිටීමට ඉඩහරින්නේ නැත. විනිශ්චය දවස මේ මොහොතේවීමට ඉඩ හරින්නේය. දෙවියන් වහන්සේගේ ජීවමාන වචනයට අපට තරවටු කිරීමට අවසර ලබාදෙන (ඉඩහරින) අතර ඒ ආකාරයෙන්ම උන්වහන්සේගේ වචනය කරුනුකොටගෙන අපව ධෛර්යමත් කිරීමටත් ඉඩ ලබා දෙන්නෙමු.

දෙවියන් වහන්සේගේ ගිවිසුමේ සෙනඟ වන අපට දෙවියන් වහන්සේගේ වචනයේ දරා සිටින්නේ ශුද්ධ ලියවිල්ල තුළ තරවටු කිරීම (අපගේ වරද පෙන්වාදීම) සහ අපව ධෛර්යමත් කිරීම යන කාරණා දෙකෙහිම අධිකාරි බලය යටතට අපව රැගෙන ඒමටය. එය අප තුළ ඉටු කරමින් දෙවියන් වහන්සේගේ වචනය සැබෑ වන පිණිස ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය දවස් පතා අප තුළ පවතින සේක.

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැගී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශිර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.